කාඩ්පත්හිමියන් සඳහා ගිවිසුම

කොන්දේසි හා නියමයන්

වැදගත් : සමාගම් ලියාපදිංචි අංකය වන PB 4847 සහිතව සීමාසහිත කාගිල්ස් බැංකුව විසින් මේ සමග එවා ඇති කාඩ්පත අත්සන් කිරීමට හෝ භාවිතා කිරීමට පෙර, කරුණාකර කාඩ්පත් සාමාජික ගිවිසුම සැලකිලිමත්ව කියවන්න. කාඩ්පත භාර ගැනීම / එහි අත්සන් කිරීම / භාවිතා කිරීම මගින්, පහත සඳහන් කොන්දේසි හා නියමයන් ඔබ විසින් පිළිගනු ලබන අතර ඒ හා බැඳී පවතී.

1. අර්ථදැක්වීම්

1.1 "ATM" යන්නෙන් කලින් කලට බැංකුව විසින් නම් කරනු ලබන බැංකුවට හෝ වෙනත් ඕනෑම හවුල් බැංකු වලට හෝ මූල්‍ය ආයතනයකට අයත් කාඩ්පත් පිළිගනු ලබන ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍රයක් හෝ ඕනෑම කාඩ්පත් ක්‍රියාත්මක වන යන්ත්‍රයක් හෝ උපාංගයක් අදහස් වේ.

1.2 "අයදුම්කරු" යන්නෙන් කාඩ්පත් අයදුම්කිරීමේ පෝරමයක් අත්සන් කර ඇති ඕනෑම පුද්ගලයෙකු අදහස් වේ.

1.3 "බැංකුව" යන්නෙන් සීමාසහිත කාගිල්ස් බැංකුව, එහි අනුප්‍රාප්තිකයන් හා බැංකුව වෙනුවෙන් පත් කරනු ලැබූවන් අදහස් වේ.

1.4 "කාඩ්පත" යන්නෙන් ප්‍රාථමික, පරිපූරක හා ආදේශන කාඩ්පත (කාඩ්පත්) ඇතුළුව බැංකුව විසින් කාඩ්පත්හිමියා වෙත නිකුත් කරනු ලැබූ ගෙවුම් කාඩ්පත අදහස් වේ.

1.5 "කාඩ්පත් ගිණුම" යන්නෙන් කාඩ්පත් ගනුදෙනු සම්බන්ධයෙන් බැංකුව විසින් පවත්වාගෙන යනු ලබන ගිණුම (ගිණුම්) අදහස් වේ.

1.6 "කාඩ්පත් මධ්‍යස්ථානය" යන්නෙන් කාගිල්ස් බැංකු ක්‍රෙඩිට් කාඩ්පත් මධ්‍යස්ථානය අදහස් වේ.

1.7 "කාඩ්පත්හිමියා" යන්නෙන් ප්‍රාථමික හා පරිපූරක කාඩ්පත්හිමියන් ඇතුළුව, කාඩ්පත මගින් සිදු කරනු ලබන ගනුදෙනු හා කාඩ්පත් ගිණුම වෙත ඇති බැඳීම සඳහා වගකියනු ලබන, ගිවිසුමට අනුව බැංකුව විසින් නිකුත් කරනු ලැබූ කාඩ්පතක නම සඳහන් පුද්ගලයා අදහස් වේ.

1.8 "කාඩ්පත් ගනුදෙනු" යන්නෙන් ලිපි, දුරකථන විධාන, අන්තර්ජාලය, ඇතුළුව ඊට සීමා නොවී වෙනත් ඕනෑම ආකාරයකින් එම සේවාවන් / භාණ්ඩයන්ට අදාලව නියමයන්හි විස්තර කොට පැහැදිලි කර ඇති ආකාරයට කාඩ්පත්හිමියා විසින් අවසර ලබා දෙන හෝ සිදු කරනු ලබන

ගනුදෙනුවක් හෝ කාඩ්පත් හිමියාගේ අනුදැනුමක් හෝ අවසර ලබා දීමක් සහිතව හෝ නොමැතිව (ඕනෑම භාණ්ඩ, සේවා, සහ / හෝ ප්‍රතිලාභ සඳහා ගෙවීම් සහ ඕනෑම පුණ්‍ය කටයුත්තක් සහ ඕනෑම මුදල් අත්තිකාරමක් සඳහා ගෙවීම් ඇතුලත්ව) කාඩ්පත හෝ කාඩ්පත හා සම්බන්ධ ගිණුම හා කාඩ්පත් අංකය හෝ PIN අංකය හෝ භාවිතයෙන් සිදුවන ගනුදෙනු අදහස් වේ.

1.9 ''මුදල් අත්තිකාරම'' යන්නෙන් කාඩ්පත් ගිණුමට හර වන ආකාරයට කාඩ්පත, කාඩ්පත් අංකය, හෝ PIN අංකය මගින් කාඩ්පත්හිමියා විසින් අවසර ලබා දීමෙන් බැංකුවෙන් හෝ වෙනත් ඕනෑම බැංකුවකින් හෝ මූල්‍ය සමාගමකින් මුදල් ලබා ගැනීමේ ක්‍රියාවක් අදහස් වේ.

1.10 ''ගාස්තු'' යන්නෙන් කාඩ්පත් ගිණුමට හෝ දැනට පවතින ශේෂයෙන් කොටසකට හර වනු ඇති, කාඩ්පත හෝ කාඩ්පත් අංකය හෝ PIN අංකය භාවිතයෙන් හෝ මෙම කොන්දේසි හා නියමයන්ට යටත්ව පැන නගිනු ලබන සහ සියලු කාඩ්පත් ගනුදෙනු ගාස්තු, පොළී, බදු, ගාස්තු, අමතර වියදම්, හානි, නීතිමය ගාස්තු, වියදම් ද ඇතුළුව, එහෙත් ඊට සීමා නොවී කාඩ්පත්හිමියා විසින් ගෙවිය යුතු මුදල් අදහස් වේ.

1.11 ''ආයතනික කාඩ්පත'' යන්නෙන් සුදුසුකම්ලත් ආයතන මගින් අනුමත කරනු ලැබූ කාර්ය මණ්ඩල සාමාජිකයන්, විධායකයින්, අධ්‍යක්ෂකවරුන් හෝ එවැනි ඕනෑම පුද්ගලයෙකු වෙත නිකුත් කරනු ලැබූ කාඩ්පත (කාඩ්පත්) අදහස් වේ.

1.12 ''ණය සීමාව'' යන්නෙන් කලින් කලට බැංකුව විසින් ප්‍රාථමික කාඩ්පත්හිමියා වෙත දැනුම් දෙනු ලබන, ප්‍රාථමික කාඩ්පත සඳහා සහ පරිපූරක කාඩ්පත (කාඩ්පත්) ඇත්නම් ඒ සඳහා කාඩ්පත් ගිණුම මත බැංකුව විසින් අවසර ලබා දී ඇති උපරිම ණය ශේෂය අදහස් වේ.

1.13 ''වත්මන් ශේෂය'' යන්නෙන් (දැනට පවතින හෝ අවිනිශ්චිත වූද, වර්තමානයේදී යටත් වන හෝ අනාගතයේදී යටත් විය හැකි වූද සියලුම කාඩ්පත් ගනුදෙනු, පොළී, ගාස්තු, අයකිරීම්, පිරිවැය හා නීතිමය ගාස්තු ඇතුලු වියදම් ඇතුලත් වන අතර ඊට සීමා නොවේ) ගිණුම් ප්‍රකාශය නිකුත් කරනු ලබන දිනය වන විට බැංකුවෙහි වාර්තාවන්ට අනුව කාඩ්පත් ගිණුම මත හිඟව පවතින සහ බැංකුව වෙත ගෙවීමට නියමිත සම්පූර්ණ හර ශේෂය අදහස් වේ.

1.14 ''තැන්පතු'' යන්නෙන් කාඩ්පත් දරන්නාගේ වගකීම සඳහා ආවරණයක් ලෙස හා / හෝ කාඩ්පත (කාඩ්පත්) නිකුත්කිරීමේ අරමුණින් සුරැකුමක් ලෙස බැංකුව මත තැන්පත් කල මුදල් ප්‍රමාණය අදහස් වේ.

1.15 ''සමූහයෙහි සාමාජික'' යන්නෙන් බැංකුවෙහි අනුබද්ධිත හෝ ආශ්‍රිත සමාගමක් අදහස් වේ.

1.16 ‘‘ඇපය’’ යන්නෙන් බැංකුව වෙනුවෙන් බැංකුවට පිළිගත හැකි සහ බැංකුවෙන් නිශ්චිතව දක්වා ඇති ප්‍රමාණයට අනුව බැංකුවට පිළිගත හැකි ආකෘතියෙන් හා අන්තර්ගතයෙන් කාඩ්පත්හිමියාගේ වගකීම සඳහා ආවරණයක් ලෙස හා / හෝ කාඩ්පත (කාඩ්පත්) නිකුත් කිරීමේ අරමුණින් සුරැකුමක් ලෙස බැංකුවක්, ආයතනයක්, සමාගමක්, හෝ වෙනත් ඕනෑම මූල්‍ය ආයතනයක් මගින් ලබා දෙනු ලබන ඇපයක් (එසේ ඇත්නම්) අදහස් වේ.

1.17 ‘‘මුද්‍රා යෙදුම’’ යන්නෙන් කාඩ්පත් ගනුදෙනු යාන්ත්‍රිකව නොව, අතින් සිදු කරන අවස්ථාවේදී යොදා ගනු ලබන උපාංගය අදහස් වේ.

1.18 ‘‘අන්තර්ක්‍රියාකාරී හඬ ප්‍රතිචාර (IVR) පද්ධතිය’’ යන්නෙන් කාඩ්පත් ගිණුම සහ සේවාවන් භාවිතය පිළිබඳ විමසීම් ඇතුළුව, එහෙත් ඊට සීමා නොවී, කාඩ්පතෙහි ඇතැම් ගනුදෙනු සිදුකිරීම සඳහා කාඩ්පත්හිමියාහට විද්‍යුත් ප්‍රවේශයක් සපයනු ලබන උපකරණය අදහස් වේ.

1.19 ‘‘වෙළඳසැල’’ යන්නෙන් කාඩ්පත්හිමියා විසින් ගෙවීම් ක්‍රමයක් ලෙස කාඩ්පත හෝ කාඩ්පත් අංකය පිළිගැනීම මගින් භාණ්ඩ සහ / හෝ සේවාවන් විකිණීම සඳහා බැංකුව විසින් පිළිගන්නා ලද ඕනෑම ආයතනයක්, වෙළඳ සමාගමක්, පුද්ගලයෙකු හෝ වෙනත් සංස්ථාපිතයක් අදහස් වේ.

1.20 ‘‘අවම හිඟ මුදල’’ යන්නෙන් ගෙවීම් සිදු කිරීමට නියමිත දිනය වන විට අදාළ ගෙවීම සිදු කල හොත්, ප්‍රමාද වී ගෙවීමේ ගාස්තු ය වීම වලක්වා ගත හැකි අවම මුදලකට හා උපරිම සීමා මුදලකට (එසේ ඇත්නම්) යටත්ව වත්මන් ශේෂයෙන් ප්‍රතිශතයක් අදහස් වන අතර පෙර ගිණුම් ප්‍රකාශයන්හි හිඟ මුදල් ඇත්නම් ඒවාද අවම හිඟ මුදලට එකතුවේ.

1.21 ‘‘මාසය’’ යන්නෙන් දින දර්ශන මාසයක් අදහස් වේ.

1.22 ‘‘හිඟ මුදල’’ යන්නෙන් කාඩ්පත්හිමියාගේ පෙර ගිණුම් ප්‍රකාශයන්හි සඳහන්ව ඇති ගෙවිය යුතු මුදලින් හිඟ මුදලක් වේ නම් එය අදහස් වේ. ගිණුම් ප්‍රකාශයෙහි පෙන්වා ඇති ඕනෑම හිඟ මුදලක්, ගෙවිය යුතු අවම හිඟ මුදලට ඇතුලත් කර ඇති අතර එය හැකි ඉක්මනින් ගෙවිය යුතුය.

1.23 ‘‘සීමාව ඉක්මවූ මුදල’’ යන්නෙන් ලබා දී ඇති ණය සීමාව ඉක්මවා ඇති වර්තමාන ශේෂය අදහස් වේ.

1.24 ‘‘සීමාව ඉක්මවීමේ ගාස්තුව’’ යන්නෙන් කාඩ්පත්හිමියා විසින් ණය සීමාව ඉක්මවුවහොත්, එක් ගිණුම් ප්‍රකාශනයක් සඳහා එක් වරක් අයකරනු ලබන ගාස්තුව අදහස් වේ.

1.25 "ගෙවීම් කල යුතු දිනය" යන්නෙන් බැංකුව වෙත ගෙවීමට ඇති වර්තමාන ශේෂය හෝ එයින් ඕනෑම කොටසක් හෝ අවම හිඟ මුදල ගෙවිය යුතු දිනය ලෙස ගිණුම් ප්‍රකාශනයෙහි සඳහන් කර ඇති දිනය අදහස් වේ. ගෙවීම් කල යුතු දිනය, බැංකු නිවාඩු දිනයක් හෝ සති අන්තයක් වුවහොත්, කාඩ්පත්හිමියාගේ අදාළ ගෙවීම් කල යුතු දිනය, එම බැංකු නිවාඩු දිනයට/ සතිඅන්තයට පසුව යෙදෙන පළමු වැඩ කරන දිනය වනු ඇත.

1.26 "PIN අංකය" යන්නෙන් කාඩ්පත්හිමියා(හිමියන්) වෙත නිකුත් කල, කාඩ්පත (කාඩ්පත්) ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයක ඉලෙක්ට්‍රොනිකව භාවිතා කිරීමට හැකියාව ලබා දෙනු ලබන පුද්ගල හැඳුනුම් අංකය අදහස් වේ.

1.27 "POS" යන්නෙන් ඉලෙක්ට්‍රොනිකව කාඩ්පත් ගනුදෙනු සිදු කරනු ලබන POS ටර්මිනල අදහස් වේ.

1.28 "ප්‍රාථමික කාඩ්පත්හිමියා" යන්නෙන් පරිපූරක කාඩ්පත්හිමියන් හැර, බැංකුව විසින් ප්‍රථමයෙන් කාඩ්පත් ගිණුමක ආරම්භ කර පවත්වාගෙන යනු ලබන, කාඩ්පතක් නිකුත් කරනු ලැබූ පුද්ගලයා අදහස් වේ.

1.29 "රු." හෝ "LKR" යන්නෙන් ශ්‍රී ලංකා රුපියල් අදහස් වේ.

1.30 "ඇපය" යන්නෙන් කාඩ්පත භාවිතයෙන් සිදු කරනු ලබන ක්‍රියාවන් මත කාඩ්පත්හිමියාගේ බැඳීම වෙනුවෙන් සහ/හෝ කාඩ්පත (කාඩ්පත්) නිකුත් කිරීමේ අරමුණ වෙනුවෙන් ඇපයක් ලෙස තබා ගනු ලබන තැන්පතුවක් හෝ ඇපකරුවෙකු අදහස් වේ.

1.31 "ගිණුම් ප්‍රකාශය" යන්නෙන් බැංකුව වෙත ගෙවිය යුතු වර්තමාන ශේෂය පිලිබඳ විස්තර දක්වමින් එක් එක් කාඩ්පත් ගිණුම සඳහා කාඩ්පත්හිමියා වෙත යවනු ලබන, බැංකුවෙහි මාසික හෝ වෙනත් යම් කාල සීමාවක් සඳහා වූ ප්‍රකාශනය අදහස් වේ.

1.32 "ප්‍රකාශන දිනය" යනු ගිණුම් ප්‍රකාශනයෙහි සඳහන් කරනු ලබන සහ එම දිනයෙහි ගනුදෙනු අවසන් කරන තෙක් සිදුකල සියලු ගනුදෙනු පිලිබඳ බැංකුව විසින් සියලුම සටහන් ඇතුලත් කරනු ලබන බිල්පත් සැකසීමේ චක්‍රයෙහි අවසන් දිනයයි.

1.33 "පරිපූරක කාඩ්පත" යන්නෙන් බැංකුව සමග මෙම එකඟතාවයට පැමිණෙමින් ප්‍රාථමික කාඩ්පත්හිමියා විසින් කරනු ලබන ඉල්ලීම මත නම්කරනු ලබන තුන්වන පාර්ශවයක් වෙත බැංකුව විසින් නිකුත් කරනු ලැබූ කාඩ්පත අදහස් වේ.

1.34 ''පරිපූරක කාඩ්පත්හිමියා'' යන්නෙන් පරිපූරක කාඩ්පතක් යම් පුද්ගලයෙකු වෙත නිකුත් කර ඇත්නම්, එම පුද්ගලයා අදහස් වේ.

1.35 ''ටර්මිනලය'' යන්නෙන් කාඩ්පත් ගනුදෙනු ඉලෙක්ට්‍රොනිකව සිදුකල හැකි ඕනෑම ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයක් (ATM) හෝ POS ටර්මිනලයක් අදහස් වේ.

1.36 ''ගනුදෙනු දිනය'' යන්නෙන් කාඩ්පත්හිමියා හා වෙළඳ ස්ථානය අතර ගනුදෙනුව සිදු වූ දිනය අදහස් වේ.

1.37 ''ගනුදෙනුව සිදු කිරීමේ (අනුමත කිරීමේ) දිනය'' යන්නෙන් කාඩ්පත් ගිණුම වෙත කාඩ්පත් ගනුදෙනුව ඇතුලත් වූ දිනය අදහස් වේ.

1.38 ''උපයෝගිතා'' යන්නෙන් ජලය, විදුලිය සහ සන්නිවේදන සේවාවන්ද ඇතුළුව, එහෙත් ඊට සීමා නොවී, උපයෝගිතා, භාණ්ඩ හා සේවාවන් සපයනු ලබන ඕනෑම සමාගමක්, බලයලත් අයෙකු හෝ ආයතනයක් අදහස් වේ.

1.39 ''ඒකාබද්ධ ණය සීමාව'' යන්නෙන් කාඩ්පත්හිමියා සතු සියලුම කාඩ්පත් ගිණුම් සඳහා අදාළ වන, කලින් කලට බැංකුව විසින් නියම කරනු ලබන ණය සීමාව අදහස් වේ.

සන්දර්භය විසින් වෙනත් ආකාරයකින් අර්ථ නොදක්වන්නේ නම්, පුරුෂලිංග වචන භාවිතයෙන් කර ඇති සියලු සඳහන් කිරීම් මගින් ස්ත්‍රී ලිංග හා නිර්ලිංගික වචනද ඇතුලත් වේ.

2. කාඩ්පත

2.1 කාඩ්පත බැංකුව සතු දේපලක් වන අතර බැංකුව විසින් ඉල්ලා සිටින ඕනෑම අවස්ථාවකදී කාඩ්පත්හිමියා විසින් වහාම එය නැවත බැංකුව වෙත භාර දිය යුතුය.

2.2 කාඩ්පත වෙනත් අයෙකුට පැවරිය නොහැකි අතර කාඩ්පත්හිමියා විසින් පමණක්ම භාවිතා කල යුතුය. කිසිදු අවස්ථාවකදී කිසිදු හේතුවක් මත කාඩ්පත්හිමියා විසින් කාඩ්පත සහ/හෝ PIN අංකය වෙනත් පුද්ගලයෙකු හට භාවිතා කිරීමට ලබා නොදිය යුතුය. කාඩ්පත්හිමියා විසින් කවර අරමුණක් සඳහා හෝ කාඩ්පත ඇපයට නොතැබිය යුතුය.

2.3 බැංකුව විසින් සිය තනි අභිමතය පරිදි, කිසිදු පෙර දැනුම්දීමකින් හෝ හේතු දැක්වීමකින් තොරව කාඩ්පත සහ කාඩ්පත භාවිතා කිරීමට කාඩ්පත්හිමියාට ඇති අයිතිය නැවත ලබා ගැනීමට හැකියාව ඇති අතර ඕනෑම ගනුදෙනුවක් සිදු කිරීම සඳහා අවසර ලබා දීම ප්‍රතික්ෂේප කිරීමට ඉඩ ඇත.

2.4 බැංකුව සිය තනි අභිමතය පරිදි කාඩ්පත නැවත නිකුත් කිරීම, අළුත්කිරීම හෝ ප්‍රතිස්ථාපනය කිරීම මෙන්ම එසේ කිරීම ප්‍රතික්ෂේප කිරීමද සිදු කරනු ඇත.

2.5 කාඩ්පත්හිමියා විසින් සෑම විටම සිය කාඩ්පත ආරක්ෂිත ස්ථානයක තබා ඇති බවට සහතික විය යුතුය.

3. කාඩ්පත භාරදීම හා භාවිතය

3.1 කාඩ්පත, කාඩ්පත්හිමියා විසින් පැමිණ ලබා ගැනීම හෝ තැපැල මගින් හෝ කුරියර් සේවාවක් මගින්, කාඩ්පත්හිමියා විසින් බැංකුව වෙත ලබා දී ඇති ලිපිනය වෙත එවීම හෝ කාඩ්පත්හිමියා විසින් අවදානම භාර ගනිමින් නම්කරන ලද තුන්වන පාර්ශවයක් විසින් පැමිණ ලබා ගැනීම හෝ ඔහු වෙත භාර දීම සිදුවනු ඇත.

3.2 කාඩ්පත ලැබුණු වහාම, කාඩ්පත්හිමියා විසින් කාඩ්පත් පිටුපස සිය අත්සන යෙදිය යුතු අතර එසේ අත්සන් කිරීම සහ / හෝ කාඩ්පත සක්‍රීය කිරීම සහ / හෝ භාවිතා කිරීම මගින්, මෙහි දක්වා ඇති කොන්දේසි හා නියමයන් පිළිගත් බවට බැඳී පවතින ලෙස හා ස්ථිරව සාක්ෂි වනු ඇත.

3.3 කාඩ්පත්හිමියා මෙම කොන්දේසි හා නියමයන් සමග බැඳීමට අදහස් නොකරන අවස්ථාවකදී, කාඩ්පත්හිමියා විසින් අදාළ කාඩ්පත කොටස් දෙකකට කපා වෙන් කර එම කොටස් දෙකම නැවත බැංකුව වෙත භාර දියයුතු අතර එතැන්සිට 19 වන වගන්තිය (අවසන් කිරීම) ක්‍රියාත්මක වනු ඇත.

3.4 කාඩ්පත භාවිතා කරන අවස්ථාවේදී මෙම ගිවිසුමෙහි සඳහන් සියලුම කොන්දේසි වලට එම කාඩ්පත යටත් වේ.

3.5 කාඩ්පත භාවිතා කල හැක්කේ ලබා දී ඇති ණය සීමාව තුල පමණි.

3.6 කාඩ්පත භාවිතා කිරීම සම්බන්ධයෙන් බැංකුව විසින් කලින් කලට ලබා දෙනු ලබන පහසුකම් හා ප්‍රතිලාභ, කාඩ්පත්හිමියාහට භාවිතා කල හැක.

3.7 කාඩ්පත මත මුද්‍රිත (එම්බෝස්) වලංගු කාලය තුලදී, බැංකුවට සිය තනි අභිමතය පරිදි, කිසිඳු පෙර දැනුම්දීමකින් තොරව ඕනෑම අවස්ථාවකදී කාඩ්පත භාවිතා කිරීමට කාඩ්පත්හිමියාට ඇති අයිතිය නැවත ලබා ගැනීමට හෝ ඕනෑම කාඩ්පත් ගනුදෙනුවක් අනුමත කිරීම සඳහා කරනු ලබන

ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට සහ එවැනි ඕනෑම නැවත ලබා ගැනීමක් හෝ ප්‍රතික්ෂේප කිරීමක් ප්‍රකාශයට පත් කිරීමට හැකියාව ඇත.

3.8 සත්‍ය වශයෙන් පෞද්ගලික හෝ රාජකාරිමය අරමුණු සඳහා පමණක් කාඩ්පත භාවිතා කළ යුතු අතර වාණිජමය ප්‍රමාණයන්ගෙන් භාණ්ඩ මිලදීගැනීමට/ආනයනය කිරිමට හෝ ප්‍රාග්ධන ගනුදෙනු සඳහා කාඩ්පත භාවිතා කිරීමට අවසර නැත. තවද නීතිවිරෝධී කටයුතු සඳහා කාඩ්පත භාවිතා නොකළ යුතු ය. ගෙවීම් කර නොමැති නම් හෝ සැකකටයුතු ක්‍රියාකාරකම් සිදුවන බවක් හැඟී යන්නේ නම් කාඩ්පත භාවිතයෙන් සිදුකරනු ලබන ඕනෑම ගනුදෙනුවක් හෝ සියලුම ගනුදෙනු ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය බැංකුව සතු ය.

3.9 ශ්‍රී ලංකාවෙන් පිටතදී කාඩ්පත භාවිතා කිරීම, කලින් කලට ශ්‍රී ලංකා මහ බැංකුව, විදේශ විනිමය දෙපාර්තමේන්තුව හෝ වෙනත් ඕනෑම නියාමන ආයතනයක් මගින් නියම කරනු ලබන පරිදි සිදු කල යුතුය. එමෙන්ම ශ්‍රී ලංකා මහා බැංකුව, බැංකුව, උසාවිය හෝ ඕනෑම නියාමන ආයතනයක් මගින් කාඩ්පත්හිමියාට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග හෝ පියවර වෙත අගතියකින් තොරව සියලුම හිඟ මුදල් පියවීමේ වගකීම කාඩ්පත්හිමියා සතු වේ.

3.10 කාඩ්පත අවලංගු වන තෙක්, කාඩ්පත් ගිණුමෙහි තත්වය වලංගු ලෙස පවතියි යන කොන්දේසියට යටත්ව, කාඩ්පතෙහි මුද්‍රණය (එම්බෝස්) කර ඇති අවලංගු වන දිනය දක්වා කාඩ්පත් ගනුදෙනු සඳහා කාඩ්පත භාවිතා කල හැක.

3.11 කාඩ්පත හා බැංකුව සමග සිදු කරනු ලබන සියලු ගනුදෙනු වලදී, කාඩ්පත්හිමියා විශ්වාසනීයත්වයෙන් යුතුව කටයුතු කල යුතුය.

4. ණය සීමාව හා ඒකාබද්ධ ණය සීමාව

4.1 (අ) කාඩ්පත් ගිණුම සඳහා ණය සීමාවක් බැංකුව විසින් පවරනු ලබන අතර එය දැඩි ලෙස නිරීක්ෂණයට භාජනය විය යුතුය. කාඩ්පත්හිමියාහට ඕනෑම අවස්ථාවකදී ඔහුගේ / ඇයගේ ණය සීමාව පිලිබඳ නැවත විමසා බැලීමක් පිලිබඳ ඉල්ලුම් කිරීමේ හැකියාව ඇත.

(ආ) ණය සීමාව ඉක්මවා ඇත්ද යන්න පිලිබඳ ගණනය කිරීමේදී, කාඩ්පත් ගිණුම වෙත තවමත් හර වී නොමැති ඕනෑම ගනුදෙනුවක මුදල් ප්‍රමාණය සහ අනාගත කාඩ්පත් ගනුදෙනුවක් සම්බන්ධව බැංකුව විසින් තෙවන පාර්ශවයක් වෙත ලබා දී ඇති ඕනෑම අවසරයක් හෝ කාඩ්පත්හිමියාගේ ඉල්ලීම මත ඉදිරියට සිදු කිරීමට නියමිත ගනුදෙනුවක් සඳහා බැංකුව විසින් වෙන් කර ඇති මුදල් ප්‍රමාණයද ඇතුළුව දැනට පවතින ශේෂය බැංකුව විසින් සලකා බලනු ලැබේ.

4.2 මෙම ගිවිසුමෙහි අවලංගු කිරීමක් සිදු වුවද, බැංකුව විසින් කාඩ්පත හා සම්බන්ධව ලබා දී ඇති සියලුම ණය පහසුකම් සහ ඒ හා සම්බන්ධ සියලුම ගාස්තු සඳහා කාඩ්පත්හිමියා වගකිව යුතුය.

4.3 ඒකාබද්ධ ණය සීමාව යන්නෙන් බැංකුව විසින් කලින් කලට ලබා දෙනු ලබන, කාඩ්පත්හිමියාගේ සියලුම කාඩ්පත් වල වර්තමාන ශේෂයන්හි එකතුව සඳහා ලබා දෙනු ලබන උපරිම ණය සීමාවයි.

4.4 වත්මන් ශේෂය යනු ඔබගේ කාඩ්පත් ගිණුම (ගිණුම්) සහ මෙම ගිවිසුම හා සම්බන්ධව ඕනෑම අවස්ථාවකදී හිඟව පවතින සියලු වගකීම් ප්‍රමාණය සහ අප වෙත ණයක් ලෙස පවතින ප්‍රමාණයයි.

4.5 කිසිදු අවස්ථාවකදී කාඩ්පත්හිමියා විසින් වත්මන් ශේෂය, කාඩ්පත්හිමියාට අදාළ වන ඒකාබද්ධ ණය සීමාව ඉක්මවා යන පරිදි තමාගේ කාඩ්පත/කාඩ්පත් භාවිතා කිරීම සිදු නොකළ යුතුය. ඒකාබද්ධ ශේෂය ඉක්මවා ඇත්දැයි ගණනය කිරීමේදී, කාපත්හිමියා විසින් කාඩ්පත භාවිතයෙන් සිදු කරනු ලැබූ නමුත් කාඩ්පත් ගිණුම වෙත තවමත් හර වී නොමැති ඕනෑම ගනුදෙනුවක මුදල් ප්‍රමාණය සහ අනාගත කාඩ්පත් ගනුදෙනුවක් සම්බන්ධව බැංකුව විසින් තෙවන පාර්ශවයක් වෙත ලබා දී ඇති ඕනෑම අවසරයක් හෝ කාඩ්පත්හිමියාගේ ඉල්ලීම මත ඉදිරියට සිදු කිරීමට නියමිත ගනුදෙනුවක් සඳහා බැංකුව විසින් වෙන් කර ඇති මුදල් ප්‍රමාණයද ඇතුළුව දැනට පවතින ශේෂය බැංකුව විසින් සලකා බලනු ලැබේ.

4.6 අපගේ පූර්ව අනුමැතිය සහිතව හෝ නොමැතිව, ඔබ වෙත ලබා දී ඇති ඒකාබද්ධ ණය සීමාව ඉක්මවා යන පරිදි ඔබ විසින් ඕනෑම ගනුදෙනුවක් සිදු කල හොත්, එවන් අවස්ථාවකදී ඒකාබද්ධ ණය සීමාව ඉක්මවා ඔබ ලබා ගත් ණය මුදල් ප්‍රමාණය වහාම බැංකුව වෙත නැවත ගෙවිය යුතු අතර, බැංකුව විසින් සිය තනි අභිමතය පරිදි, එම අවස්ථාවේදී සුදුසු යයි හැඟෙන ආකාරයක් මගින් ඒ පිළිබඳව ඔබ වෙත දැනුම් දෙනු ඇත. මේ හා සමග එකඟව කටයුතු කිරීමට කාඩ්පත්හිමියා අපොහොසත් වුවහොත් අපගේ අයිතිවාසිකම් හෝ පිළියම් පිලිබඳ පූර්ව මතයන් නොසලකා හරිමින් ඔබගේ කාඩ්පත් ගිණුම අවසන් කිරීමේ අයිතිය අප සතු වේ.

5. ණය සීමාව

5.1 බැංකුව විසින් සිය තනි අභිමතය පරිදි මෙම ණය සීමාව තීරණය කරනු ලබන අතර එය කාඩ්පත්හිමියා වෙත ලිඛිතව දැනුම්දෙනු ඇත. එමෙන්ම ලිඛිතව කරනු ලබන දැනුම්දීමක් මගින් එම ණය සීමාව ඉහල නැංවීමට හෝ පහත හෙළීමටද බැංකුවට අයිතිය පවතී. ඔබගේ කාඩ්පත් ගිණුමෙහි සමස්ත ණය සීමාව ඇතුලත මුදල් හා මුදල් නොවන ගනුදෙනු සඳහා වෙන වෙනම සීමාවන් පැනවීමටද බැංකුවට හැකියාව ඇත.

5.2 ඕනෑම අවස්ථාවකදී ඔබගේ කාඩ්පත් ගිණුමෙහි දැනට ලබා ගත හැකි ණය ප්‍රමාණය, හිඟව ඇති ණය ප්‍රමාණය සහ බැංකුව විසින් පිළිගෙන ඇති එහෙත් එම දිනය වන විට ක්‍රියාත්මක කිරීම් සඳහා ලැබී නොමැති ඕනෑම කාඩ්පත් ගනුදෙනුවක් සැලකිල්ලට ගැනීමේ අනතුරුව ණය

සීමාවෙන් භාවිතයට නොගත් මුදල් වටිනාකම වනු ඇත. මුදල් සහ මුදල් නොවන ගනුදෙනු සඳහා වෙන වෙනම සීමාවන් පිහිටුවා ඇති අවස්ථාවන්හිදී, ඒ අනුව ලබා ගත හැකි ණය ප්‍රමාණයද බෙදී යනු ඇත. ඔබගේ ගිණුමෙහි දැනට ලබා ගත හැකි ණය ප්‍රමාණය (අදාළ වන අවස්ථාවන්හිදී මුදල් හා මුදල් නොවන ආකාරයන්ගෙන්) ඇතුලත ගනුදෙනු සිදු කිරීමට ඔබ සහතික විය යුතුය.

5.3 කාඩ්පත්හිමියා විසින් කාඩ්පත් ගිණුමෙහි ණය සීමාව ඉක්මවා යාම, මෙම ගිවිසුමෙහි කොන්දේසි හා නියමයන් උල්ලංඝනය කිරීමක් ලෙස සලකනු ලබන අතර බැංකුව විසින් සිය අභිමතය පරිදි පෙර දැනුම්දීමකින් තොරව කාඩ්පත අවලංගු කරනු ඇත.

6. බිල්පත් සැකසීම හා ගෙවීම්

6.1 කාඩ්පත් ගනුදෙනු සම්බන්ධයෙන් හෝ ඕනෑම ගෙවීමක් සම්බන්ධයෙන් හෝ එම අවස්ථාවේදී ඔබ වෙත ලැබිය යුතු ඕනෑම හිඟ ණය මුදලක් සම්බන්ධයෙන් ඕනෑම මුදල් ආපසු ගෙවීමක් ඇත්නම් අපගේ සාමාන්‍ය පිළිවෙත් අනුව අප විසින් තීරණය කරනු ලබන ආකාරයට ගෙවිය යුතු මුදල් ප්‍රමාණය ලැබීමෙන් පසුව, අවශ්‍ය අවස්ථාවකදී නම් එය ශ්‍රී ලංකා රුපියල් වෙත පරිවර්තනය වීමෙන් පසුව, ගිවිසුමෙහි කොන්දේසි වලට යටත්ව, අප විසින් තීරණය කරනු ලැබූ අවස්ථාවකදී හැර එම මුදල ඔබගේ කාඩ්පතෙහි වත්මන් ශේෂයෙන් කොටසක් ලෙස හෝ සම්පූර්ණ වශයෙන් අඩු වන පරිදි, එය අප විසින් කාඩ්පත් ගිණුම වෙත බැර කරනු ඇත.

6.2 ගුවන් ටිකට්පත් මිලදී ගැනීම හා ආපසු ගෙවීම යනු වෙන් වෙන්ව පවතින ගනුදෙනු දෙකක් වන බැවින් බිල්පත් කිරීමට අනුව කාඩ්පත්හිමියා විසින් ටිකට්පත් මිලදී ගැනීම සඳහා අදාළ ගෙවීම් සිදුකල යුතුය. මිලදී ගැනීමෙන් පසුව අවලංගු කරනු ලබන ඕනෑම ටිකට්පතක් සඳහා අදාළ මුදල් ආපසු ගෙවීම්, මුල් ගනුදෙනුව සිදු කරනු ලැබූ එකම පාර්ශවය මගින් ආපසු ලැබුණු පසුව (අවලංගු කිරීමේ ගාස්තු පියවා ගැනීමෙන් අනතුරුව) පමණක් කාඩ්පත් ගිණුම වෙත නැවත බැර කරනු ඇත.

6.3 මතභේදාත්මක ගනුදෙනු හේතුවෙන් සිදුවන ආපසු ගෙවීම් හෝ ප්‍රතිවර්තනද ඇතුලත්ව යම් ගනුදෙනුවක් අවලංගු කිරීමක, ප්‍රතිවර්තනය කිරීමක හෝ ආපසු ගෙවීමක ප්‍රතිඵලයක් වශයෙන් ඇතිවන මුදල් හුවමාරු වීම් නිසාවෙන් සිදු වන අලාභයන් සඳහා කාඩ්පත්හිමියා වගකිව යුතුය.

6.4 ඔබගේ මාසික ගිණුම් ප්‍රකාශයන් ඔබගේ විද්‍යුත් ලිපිනය වෙත එවීමට ඔබ සිදු කරනු ලැබූ ඉල්ලීම බැංකුව විසින් පිළිගැනීම සැලකිල්ලට ගැනීම මගින්, විද්‍යුත් ගිණුම් ප්‍රකාශන සේවාව හෝ වෙනත් සම්ප්‍රේෂණ මාර්ගයකින් බැංකුව විසින් ඔබ වෙත එවනු ලැබූ සියලුම ගිණුම් ප්‍රකාශන නිරවද්‍ය හා සත්‍යාපිත ලෙස අනුමත කොට පිළිගන්නා බවට ඔබ විසින් එකඟ වේ. ඉහත එකඟ වීම මගින් ඔබ විසින් බැංකුවට එරෙහිව කිසිඳු විරෝධයක් පල නොකරන බවට ප්‍රකාශ වන අතර බැංකුව විසින් විද්‍යුත් තැපැල හරහා එවනු ලබන ප්‍රකාශනයන්හි සම්පූර්ණ අවදානම හා වගකීම ඔබ විසින් දරන බවට පිළිගනු ලබයි. විද්‍යුත් තැපැල් පණිවිඩ අන්තර්ජාලය හරහා සම්ප්‍රේෂණය වීමේදී ඒවායේ පුද්ගලිකත්වය සහ / හෝ ආරක්ෂාව කෙරෙහි බලපානු ලබන කිසිඳු බාහිර සාධකයකට එරෙහිව බැංකුව විසින් කිසිඳු ඇප වීමක් සිදු නොකරන බවට ඔබ විසින් එකඟ වී පිළිගනු ලබයි. එමෙන්ම බැංකුව විසින් ඔබගේ ඉල්ලීම පිළිගැනීම සම්බන්ධයෙන් හෝ එමගින් සහ බැංකු ප්‍රකාශන හා තොරතුරු විද්‍යුත් තැපැල හරහා සම්ප්‍රේෂණය කිරීම මගින් පැන නගින ක්‍රියාවන්, ක්‍රියාපටිපාටීන්,

වගකීම් හා හිමිකම්, නඩු, හානි, පිරිවැය සහ වියදම් වෙනුවෙන් බැංකුව වෙත වන්දි ගෙවීමට ඔබ විසින් එකඟ වේ. තවදුරටත්, මෙම සේවාව හා සම්බන්ධව බැංකුව විසින් කලින් කලට පනවනු ලබන සියලුම ගාස්තු හා අයකිරීම් බැංකුව විසින් නියම කරනු ලබන ආකාරයට ගෙවීමට ඔබ විසින් එකඟ වේ. තවද, ඔබ වෙත කිසිදු දැනුම්දීමකින් තොරව කලින් කලට සේවාවන් එක් කිරීම, නතර කිරීම හෝ වෙනස් කිරීම සඳහා ඔබ විසින් බැංකුව වෙත බලය පවරා දෙනු ලැබේ. ඔබගේ විද්‍යුත් තැපැල් ලිපිනයෙහි වෙනසක් සිදු වුවහොත් ඒ පිළිබඳව හෝ මෙම පහසුකම අත්හිටුවීම සඳහා වන ඕනෑම ඉල්ලීමක් පිළිබඳව කළමනාකාර - කාඩ්පත් මෙහෙයුම්, පළමු මහල, මේට්ලන්ඩ් චන්ද්‍රවංකය, කොළඹ 07, ශ්‍රී ලංකාව යන ලිපිනය හරහා කාඩ්පත් මධ්‍යස්ථානය වෙත ලිඛිතව දැනුම් දෙන බවට ඔබ බැංකුව වෙත සහතික වේ. ලබා දුන් දත්ත දූෂණය, ප්‍රමාද වීම සහ / හෝ තොරතුරු අන්තර් නිරෝධනය සම්බන්ධයෙන් බැංකුව විසින් වගවීමක් හෝ වගකීමක් දරනු නොලබන බවට සහ ඕනෑම අවස්ථාවකදී කලින් කලට එවැනි තොරතුරු යාවත්කාලීන කිරීමේ හා වෙනස් කිරීමේ අයිතිය බැංකුව සතු වන බවට ඔබ විසින් පැහැදිලිව එකඟ වී පිළිගනු ලැබේ. මෙම සේවාවෙහි ප්‍රවර්ධන කවුළුව වන විද්‍යුත් තැපැල මගින් ඔබගේ විද්‍යුත් තැපැල් ලිපිනය වෙත වෙළඳ දැන්වීම් හා ප්‍රවර්ධන තොරතුරු එවීම සඳහා ඔබ විසින් බැංකුව වෙත අවසර ලබා දේ.

6.5 එක් එක් අවස්ථාවන්ට අනුව විදේශ මුදල් ඒකකයන් ශ්‍රී ලංකා රුපියල් වෙත පරිවර්තනය වන හෝ ශ්‍රී ලංකා රුපියල් විදේශ මුදල් ඒකකයක් වෙත නැවත පරිවර්තනය අවස්ථාවකදී ඔහු/ඇය සහ බැංකුව අතර හුවමාරු අනුපාතිකය හෝ නැවත හුවමාරු කිරීමේ අනුපාතිකය හෝ එම අවස්ථාවේ අදාළ වූ අනුපාතිකය කාඩ්පත්හිමියා විසින් අවසාන හා නිශ්චිත ලෙස පිළිගත යුතුය. ගෙවීම් සිදු කරනු ලබන මුදල් ඒකකය හෝ ගිණුමෙහි මුදල් ඒකකය කුමක් වුවද, බැංකුව වෙත කාඩ්පත්හිමියාගේ ඇති වගකීම ශ්‍රී ලංකා රුපියල් වලින් වේ.

6.6 සියලුම පරිවර්තනයන් හා ප්‍රතිපරිවර්තනයන් සිදු කිරීමේදී මුදල් හුවමාරු වීම හා සම්බන්ධ කිසිඳු අලාභයක් බැංකුව වෙත සිදු නොවිය යුතු අතර මුදල් හුවමාරු සිදු කිරීමේදී කාඩ්පත්හිමියා විසින් එවැනි සියලුම අලාභ සඳහා බැංකුව වෙත වන්දි ගෙවීමට සූදානම් බව මෙයින් ප්‍රකාශ කර සිටී. හුවමාරු කිරීමේදී සිදුවන අලාභ යන්නෙන් මුදල් ඒකකයන්හි විනිමය අනුපාතිකයන් වෙනස් වීමක් හෝ මුදල් / ගාස්තු අවප්‍රමාණ වීමක් හේතුවෙන් බැංකුව හෝ එහි නියෝජිතයන් හෝ අනුරූපකයන් විසින් අතිවිදිනු ලබන ඕනෑම අලාභයක් අදහස් වේ.

6.7 කාඩ්පත්හිමියාගේ අභාවයකදී, කාඩ්පත්හිමියාගේ උරුමය ලැබී ඇති විධායකයන්, පරිපාලකයන්, නීති නියෝජිතයන් හෝ ඥාතින් අදාළ කාඩ්පත් ගිණුමෙහි ගාස්තු, සිදු කල යුතු ගෙවීම් හා හිඟ මුදල් සියල්ල සඳහා ගෙවීම් සිදුකර පියවිය යුතු බවට කාඩ්පත්හිමියා විසින් එකඟ වේ.

7. PIN අංකය නිකුත් කිරීම සහ කාඩ්පත් PIN අංකය අස්ථානගත වීම

7.1 කාඩ්පත්හිමියා හට කාඩ්පත් භාරගනු ලබන ඕනෑම ATM යන්ත්‍රයක භාවිතා කල හැකි PIN අංකයක් බැංකුව විසින් නිකුත් කරනු ලබන අතර එම PIN අංකය කාඩ්පත්හිමියා විසින් අවදානම භාර ගනිමින් තැපැල හෝ කුරියර් සේවාවක් මගින් කාඩ්පත්හිමියා වෙත එවීමට කාඩ්පත්හිමියා එකඟ වේ.

7.2 PIN අංකය භාවිතයෙන් සිදු කරනු ලබන සියලුම ගනුදෙනු සඳහා පූර්ණ වගකීම කාඩ්පත්හිමියා විසින් දැරිය යුතුය.

7.3 PIN අංකය හා කාඩ්පත අස්ථානගත වීම හා සොරකම් කිරීම වලක්වාගනිමින් PIN අංකයෙහි හා කාඩ්පතෙහි ආරක්ෂාව පිලිබඳ සහතික වීමට ගත හැකි සියලු කටයුතු කාඩ්පත්හිමියා විසින් ගත යුතුය.

7.4 කාඩ්පත අස්ථානගත වූ හෝ සොරකම් කල අවස්ථාවකදී, එම අස්ථානගත වීම හෝ සොරකම් කිරීම සම්බන්ධයෙන් කාඩ්පත්හිමියා විසින් එහි විස්තරද සමගින් දුරකථන, ෆැක්ස් හෝ අදාළ ගෙවීම් ආයතනයෙහි ඕනෑම සාමාජික බැංකුවක් වෙත හෝ එහි නියෝජිත කාර්යාලයකට සහ එම අස්ථානගත වීම හෝ සොරකම් කිරීම සිදු වූ රටෙහි පොලිසිය වෙත වහාම දැනුම්දිය යුතු යුතුය. එහෙත්, එවැනි අවස්ථාවකදී දුරකථන හෝ ෆැක්ස් මගින් ලබා දුන් පණිවිඩය ලැබීම පිළිබඳව ලිඛිතව තහවුරු කල යුතුය.

7.5 කාඩ්පත අස්ථානගත වූ හෝ සොරකම් කරන ලද බව බැංකුව වෙත දැනුම් දී සහතික කර පසුව ලිඛිතව සහතික කරනතෙක් සිදු වූ අනවසර භාවිතය හේතුවෙන් කාඩ්පත් ගිණුමට හර වූ සියලුම සියලු මුදල් සඳහා කාඩ්පත්හිමියා වගකිව යුතුය.

7.6 කාඩ්පත අස්ථානගත වීම, සොරකම් කිරීම හෝ අනිසි ලෙස භාවිතය යන තත්ත්වයන්හිදී අස්ථානගත වූ / සොරකම් කරන ලද කාඩ්පත නැවත ලබාගැනීමට සහය වීම සඳහා බැංකුව විසින් අවශ්‍ය යැයි සිතන සෑම පියවක්ම ගැනීමට කාඩ්පත්හිමියාගේ හිමිකම් මත බැංකුව වෙත කාඩ්පත්හිමියා විසින් සියලුම තොරතුරු ලබා දෙනු ඇත.

7.7 බැංකුව විසින් සුදුසු යයි සිතන කොන්දේසි හා නියමයන්ට යටත්ව සිය තනි අභිමතය පරිදි ඕනෑම අස්ථානගත වූ හෝ සොරකම් කරන ලද කාඩ්පතක් සඳහා ආදේශන කාඩ්පතක් හෝ නව PIN අංකයක් නිකුත් කරනු ඇත.

7.8 අස්ථානගත වූ හෝ සොරකම් කරන ලද කාඩ්පත නැවත කාඩ්පත්හිමියාහට හමුවූ අවස්ථාවකදී නැවත එය භාවිතා කිරීමකින් තොරව ඔහු විසින් එය දෙකට කපා වෙන් කර බැංකුව වෙත නැවත භාර දිය යුතුය. PIN අංකය ඕනෑම තුන්වන පාර්ශවයක් වෙත අනාවරණය වූ බව බැංකුව වෙත දැනුම් දීමෙන් පසුව, කාඩ්පත්හිමියා විසින් එම PIN අංකය නැවත භාවිතා නොකළ යුතුය.

7.9 නැති වූ කාඩ්පත සම්බන්ධයෙන් අදාල වෙළඳ ජාලය දැනුවත් කිරීම සඳහා වැයවන පරිපාලන ගාස්තුව හා නව කාඩ්පතක් නැවත නිකුත් කිරීම සඳහා අදාළ පිරිවැය සඳහා ගාස්තුවක් බැංකුව විසින් අය කරනු ඇත.

8. කාඩ්පත් ගිණුම

8.1 කාඩ්පත් ගනුදෙනු සඳහා අදාළ මුදල් ප්‍රමාණය, බැංකුව වෙත හිඟව ඇති ගාස්තුවක් සහ ඕනෑම නීතිමය ගාස්තුවක් ඇතුලත්ව කාඩ්පත්දරන්නගේ වෙනත් ඕනෑම වගකීමක් සහ බැංකුව විසින් අයකරනු ලබන වෙනත් සියලුම පරිපාලන ගාස්තු සහ කාඩ්පත භාවිතය නිසා බැංකුව වෙත ඇතිවන සියලුම අලාභයන් බැංකුව විසින් කාඩ්පත් ගිණුම වෙත හර කරනු ඇත. ප්‍රාථමික කාඩ්පත්හිමියා සහ පරිපූරක කාඩ්පත්හිමියා යන දෙදෙනාම ඒකාබද්ධ වශයෙන් හා තනි තනිව, කාඩ්පත්හිමියා විසින් විකුණුම් හෝ මුදල් අත්තිකාරම් වවුචරයක් අත්සන් කල හෝ නොකලද, බැංකු ගිණුම වෙත හර කල සියලුම මුදල් බැංකුව වෙත ගෙවීමට වගකිව යුතුය.

8.2 බැංකුව විසින් හිඟ මුදල් ගෙවීමට ලබා දී ඇති අවසාන දිනයේ හෝ ඊට පෙර අඩුම වශයෙන් අවම හිඟ මුදල හෝ ගෙවනු ලබන කාඩ්පත්හිමියා වෙත ගිණුම් ප්‍රකාශයක් එවනු ඇත. කෙසේ වුවද, ඔහුගේ අභිමතය පරිදි, ඔහු විසින් සම්පූර්ණ හිඟ මුදල හෝ ගෙවිය යුතු අවම හිඟ මුදලට වැඩි ඕනෑම මුදලක් ගෙවනු ඇත. හිඟ මුදල් ගෙවිය යුතු අවසාන දිනය, බැංකු නිවාඩු දිනයක් වූ අවස්ථාවකදී, අදාළ හිඟ මුදල ඉන් අනතුරුව පැමිණෙන පළමු බැංකු වැඩ කරන දිනයේදී ගෙවිය යුතුය.

8.3 මෙම ගිවිසුම ඕනෑම ආකාරයකින් උල්ලංඝනය කරනු ලැබූ අවස්ථාවකදී හෝ කාඩ්පත්හිමියා විසින් බංකොලොත්වීමේ ක්‍රියාවක නියලුනහොත් හෝ ප්‍රාථමික කාඩ්පත්හිමියාගේ වියෝවකදී හෝ බැංකුවේ තනි අභිමතය පරිදි, මෙම ගිවිසුම යටතේ හිඟ වන සියලුම මුදල් ඕනෑම ප්‍රඥප්තියක් මගින් පනවනු ලබන ඕනෑම සීමාවක් දක්වා සම්පූර්ණ වශයෙන් වහාම ගෙවිය යුතු වේ.

8.4 බැංකුව වෙත සිදු කරනු ලබන ඕනෑම ගෙවීමක් බලපැවත්වෙනු ලබන්නේ බැංකුව විසින් දැනුම් දෙනු ලැබූ ලිපිනය වෙත අදාළ ගෙවීම ලැබුණු පසුව සහ එය කාඩ්පත් ගිණුම වෙත බැර කිරීමෙන් අනතුරුවය. මෙම ගිවිසුම යටතේ කාඩ්පත්හිමියා සතු වගකීම් වලට අනුව බැංකුව වෙත ලබා දුන් චෙක්පත් සඳහා අවශ්‍ය මුදල් ප්‍රමාණය ගිණුමෙහි පවතින බවට ප්‍රාථමික කාඩ්පත්හිමියා සහතික විය යුතුය.

9. මුදල් අත්තිකාරම්

9.1 කාඩ්පත්හිමියා හට කාඩ්පතෙහි ප්‍රමාණවත් ණය මුදලක් පැවතීමට යටත්ව, විදේශ විනිමය දෙපාර්තමේන්තුවෙහි රෙගුලාසි වලට යටත්ව සහ/හෝ ක්‍රියාත්මක වන වෙනත් ඕනෑම ව්‍යවස්ථාපිත රෙගුලාසියක් සහ පහත දැක්වෙන මාර්ගයන්ගෙන් කලින් කලට බැංකුව විසින් සිය තනි අභිමතය පරිදි ඔහුගේ ණය සීමාවෙන් උපරිම ප්‍රතිශතයක් දක්වා මුදල් අත්තිකාරම් ලබා ගැනීමේ හැකියාව ඇත.

9.2 (a) කාඩ්පත්හිමියාගේ අනන්‍යතාවය තහවුරු කල හැකි සාක්ෂිද සමග, ඕනෑම බැංකු ශාඛාවක් වෙත හෝ ඕනෑම සාමාජික ආයතනයක් වෙත කාඩ්පත ඉදිරිපත් කිරීම සහ අවශ්‍ය ගනුදෙනු වාර්තා අත්සන් කිරීම.

(b) ලබා ගනු ලබන මුදල් අත්තිකාරම් මුදල, අදාළ ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍රය මගින් දිනකදී ලබා ගත හැකි උපරිම මුදල් සීමාවට තව දුරටත් යටත්ව, බැංකුවෙහි ඕනෑම ස්වයංක්‍රිය ටෙලර්

යන්ත්‍රයක් තුල හෝ එම බැංකුවේ හෝ ආයතනයේ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර භාවිතා කිරීම සඳහා ගිවිසුමක් මගින් එකඟ වී ඇති වෙනත් බැංකුවක් හෝ ආයතනයක් සතු ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයක් තුල තම කාඩ්පත භාවිතා කිරීම.

9.3 මුදල් අත්තිකාරම් සඳහා කලින් කලට නිකුත් කරනු ලබන ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර, බැංකු, වෙළඳසැල්, නියෝජිතයන්, ප්‍රාදේශීය හෝ දේශීය සීමාවන් සහ තහනම් කිරීම් මෙන්ම විදේශ විනිමය රෙගුලාසි සහ / හෝ වෙනත් නියාමන අධිකාරි මගින් පනවනු ලබන තහනම් කිරීම් අදාළ වනු ඇත.

ATM යන්ත්‍ර මගින් ගනුදෙනු කිරීමේදී කාඩ්පත හා සම්බන්ධව භාවිතා කල හැකි PIN අංකයක් බැංකුව විසින් නිකුත් කරනු ලබයි. කාඩ්පත්හිමියා විසින් කිසිඳු අවස්ථාවකදී කුමන හේතුවක් මත හෝ අදාළ PIN අංකය වෙනත් පුද්ගලයෙකු හට අනාවරණය නොකළ යුතුය.

9.4 PIN අංකය සමග එක්ව සිදු කරනු ලැබූ කාඩ්පත් ගනුදෙනුවක් සම්බන්ධයෙන් බැංකුව සතු වන වාර්තා, කාඩ්පත්හිමියා සමග බැඳී පවතී. බැංකුවෙහි තොරතුරු පද්ධතිය සතු තොරතුරු, කාඩ්පත්හිමියා විසින් අදාළ කාඩ්පත් ගනුදෙනුව සඳහා අවසර ලබා දී ඇති බවට හා ඒ සමග බැඳී ඇති බවට නිශ්චිත සාධකයක් වනු ඇත.

9.5 මුදල් අත්තිකාරම් ලබා ගැනීම සඳහා කාඩ්පත්හිමියා විසින් කාඩ්පත භාවිතා කිරීම, කාඩ්පත්හිමියාගේ ගිවිසුමෙහි පවතින ආකාරයට මුදල් අත්තිකාරම මත බැංකුව විසින් කලින් කලට නියම කරන පරිදි පවතින මූල්‍ය අයකිරීම්, පොළී සහ ගාස්තු මුදල් ගෙවීම් සඳහා යටත් වේ. සෑම මුදල් අත්තිකාරමක් සඳහාම අත්තිකාරම් දිනයේ සිට සම්පූර්ණයෙන් නැවත එම මුදල පියවනු ලබන දිනය තෙක් මූල්‍ය ගාස්තුවක් අයකරනු ඇත. කාඩ්පත්හිමියා විසින් ගෙවිය යුතු මෙම මූල්‍ය ගාස්තුවෙහි ප්‍රමාණය බැංකුව විසින් කලින් කලට වෙනස් කරනු ඇත.

9.6 කාඩ්පත මගින් ලබා ගත් පෙර ගෙවුම් සංචාරක කාඩ්පත්, ඉල්ලුම් අණකර, විදුලි පණිවිඩ පැවරුම් වැනි පහසුවෙන් මුදල් වෙත නැවත මාරු කල හැකි ඕනෑම ලේඛනයක් මුදල් අත්තිකාරමක් ලෙස සලකනු ලබන අතර ඉහත 9.5හි සඳහන් ගාස්තු අයකිරීම් වලට යටත් වේ.

9.7 මෙම පහසුකම, කාඩ්පත්හිමියාහට සිදු කරන පෙර දැනුම් දීමකින් තොරව බැංකුව විසින් වෙනස් කිරීමට හෝ ඉවත් කර ගැනීමට හැකියාව ඇත.

10. **පරිපූරක කාඩ්පත**

10.1 ප්‍රාථමික කාඩ්පත්හිමියා විසින් නම්කර, ප්‍රාථමික කාඩ්පත්හිමියා හා පරිපූරක කාඩ්පත්හිමියා (කාඩ්පත්හිමියන්) විසින් එක්ව ඉල්ලුම් කරනු ලබන පුද්ගලයෙකු (පුද්ගලයින්) හට බැංකුව විසින් සිය තනි අභිමතය පරිදි පරිපූරක කාඩ්පත (කාඩ්පත්) අනුමත කිරීම හා නිකුත් කිරීම සිදු කරයි. පරිපූරක කාඩ්පත්හිමියා (කාඩ්පත්හිමියන්) ගේ වයස අවුරුදු 18 හෝ ඊට වැඩි විය යුතු අතර පවුලේ ලඟම සාමාජිකයෙකු (සාමාජිකයන්) (ස්වාමිපුරුෂයා/භාර්යාව, දරුවා, දෙමාපියන්,

සහෝදරයා හෝ සහෝදරිය) විය යුතුය. ප්‍රාථමික කාඩ්පත්හිමියාගෙන් සෘජුව යැපෙනු ලබන ශිෂ්‍යයින්, අධ්‍යාපනික අවශ්‍යතාවයන් සඳහා පමණක් පරිපූරක කාඩ්පතක් ලබා ගැනීම සඳහා සුදුසුකම් ලබන අතර එවැනි පුද්ගලයකු (පුද්ගලයන්) මෙහි සඳහන් සියලුම කොන්දේසි හා නියමයන් සමග බැඳී සිටිනු ඇත.

10.2 පරිපූරක කාඩ්පත් සඳහා ලබා දෙනු ලබන ණය සීමාව, ප්‍රාථමික කාඩ්පත්හිමියා වෙත ලබා දී ඇති ණය සීමාවට ඇතුලත් වන අතර අදාළ කාඩ්පත් භාවිතය හේතුවෙන් ගෙවිය යුතු මුළු ණය මුදල, එම ණය සීමාව ඉක්මවා යාමට ප්‍රාථමික හා පරිපූරක කාඩ්පත්හිමියන් කටයුතු නොකළ යුතුය.

10.3 පරිපූරක කාඩ්පතෙහි වලංගුභාවය, ප්‍රාථමික කාඩ්පතෙහි වලංගුභාවය මත රඳා පවතින අතර පරිපූරක කාඩ්පත අවලංගු කිරීම මගින් ප්‍රාථමික කාඩ්පත අවලංගු කිරීමක් සිදු නොවේ.

10.4 බැංකුව වෙත ප්‍රාථමික කාඩ්පත්හිමියාගේ සහ පරිපූරක කාඩ්පත්හිමියගේ ඇති ප්‍රතිඥාවන්, වගකීම් හා බැඳීම් හා බැංකුව සතු අයිතීන්, ප්‍රාථමික කාඩ්පත්හිමියා සහ පරිපූරක කාඩ්පත්හිමියා අතර එකිනෙකාට විරුද්ධව ඇති වන කිසිදු මතභේදයකින් හෝ පිලියැදුමකින් බලපෑමට ලක් නොවේ.

10.5 ප්‍රාථමික කාඩ්පත්හිමියාගේ හා පරිපූරක කාඩ්පත්හිමියා (කාඩ්පත්හිමියන්) ගේ කාඩ්පත් ගිණුම් ඒකාබද්ධව හෝ වෙන්ව පැවතුනද, කාඩ්පත (කාඩ්පත්) භාවිතයෙන් සිදු කරනු ලබන සියලුම කාඩ්පත් ගනුදෙනු සඳහා ඔවුන් දෙදෙනාම එක්ව හා තනි තනිව වගකිව යුතුය.

10.6 පරිපූරක කාඩ්පත්හිමියා (කාඩ්පත්හිමියන්) සතු බලය ප්‍රාථමික කාඩ්පත්හිමියා විසින් අවලංගු කිරීම, අදාළ පරිපූරක කාඩ්පත දෙකට කපා වෙන්කර ලිඛිත ඉල්ලීමද සමග බැංකුව වෙත භාර දීම මගින් සිදු කල හැකිය.

10.7 ඉහත 10.6 දක්වා ඇති පරිදි බලය අවලංගු කිරීමේ දිනට පෙර පරිපූරක කාඩ්පත්හිමියා විසින් අවසර ලබා දුන් සියලුම කාඩ්පත් ගනුදෙනු සියල්ල වලංගු ගනුදෙනු වන අතර කාඩ්පත්හිමියා ඒ සඳහා බැඳී සිටින අතර එය ඔහුගේ වගකීමද වේ.

10.8 පරිපූරක කාඩ්පත්හිමියා විසින් ඔහුගේ ඕනෑම නීතිමය අපොහොසත්කමක් හෝ අසමත්බවක් නිසාවෙන් හෝ මෙහි සඳහන් කොන්දේසි හා නියමයන් උල්ලංඝනය කිරීමක් නිසාවෙන් හෝ බැංකුව විසින් දැරීමට සිදුවන ඕනෑම අලාභයක්, හානියක්, බැරකමක්, පිරිවැයක් හෝ නීතිමය හෝ එසේ නොවන ඕනෑම වියදමක් සඳහා ප්‍රාථමික කාඩ්පත්හිමියා බැංකුව වෙත වන්දි ගෙවිය යුතුය.

11. කාඩ්පත පිළිගැනීම

11.1 කාඩ්පත පිළිගනු ලබන්නේ ප්‍රාථමික හෝ පරිපූරක කාඩ්පත්හිමියාගේ අත්සන අදාළ පරිදි අනුපිලිවෙලට යොදා ඇත්නම් පමණි. සාමාන්‍යයෙන් වෙළඳ ආයතන හා මූල්‍ය ආයතන,

කාඩ්පතෙහි නිශ්පාදන සංකේතය මත කාඩ්පත පිළිගනු ඇත. ඕනෑම වෙළඳ / මූල්‍ය ආයතනයක් මගින් කුමන හෝ හේතුවක් මත කාඩ්පත පිළිගැනුම ප්‍රතික්ෂේප කිරීම පිලිබඳ බැංකුව කිසිඳු වගවීමක් හෝ වගකීමක් දරනු නොලැබේ. ඕනෑම පරිශ්‍රයක ප්‍රදර්ශනය කර ඇති කාඩ්පත් ප්‍රවර්ධන ද්‍රව්‍ය හෝ කාඩ්පත් සංකේත මගින් එම පරිශ්‍රයෙහි ඇති සියලුම භාණ්ඩ හා සේවාවන් සියල්ල කාඩ්පත භාවිතයෙන් මිලදී ගත හැකි බවට සහතික නොවේ.

11.2 පෙට්‍රල් පිරවුම්හල් හා සේවා ස්ථානයන්ගෙන් මිලදී ගනු ලබන පෙට්‍රල්, ඩීසල් සහ ගෑස් ආදී භාණ්ඩ, අදාළ මෙහෙයුම් ගාස්තු හා සේවා ගාස්තු වලට යටත් වේ.

11.3 කෙසේවුවද, ඕනෑම වෙළඳසැලක් / බැංකුවක් මගින් එවැනි ප්‍රතික්ෂේප කිරීමක් සිදු වුව හොත් අදාළ ස්ථානයේ නම, ගනුදෙනුව සිදු වූ දිනය හා වේලාව සහ අනෙකුත් විස්තර සමග බැංකුව වෙත දැනුම් දීම මගින් බැංකුවෙහි විමර්ශන කටයුතු සඳහා සහය විය හැක.

12. ගිණුම් ප්‍රකාශන

12.1 කාඩ්පත් ගිණුමෙහි ගනුදෙනු ඇතුලත් ප්‍රකාශනයක් සෑම මසකම පූර්ව නිර්ණය කරන ලද දිනයකදී බැංකුව විසින් සාමාන්‍ය තැපැල මගින් කාඩ්පත්හිමියා වෙත තැපැල් කරනු ඇත. පසුගිය ගිණුම් ප්‍රකාශනයේ සිට මේ වන තෙක් කිසිදු ශේෂයක් නොපවතීනම් සහ කිසිදු කාඩ්පත් ගනුදෙනුවක් බැංකුව වෙත ලැබී නොමැතිනම්, ගිණුම් ප්‍රකාශනයක් නිකුත් කරනු නොලැබේ.

12.2 කුමන හෝ හේතුවක් මත ගිණුම් ප්‍රකාශනය නොලැබීම, හිඟ මුදල් නියමිත කාලය තුල නොගෙවීම සඳහා වලංගු වන හේතුවක් නොවේ. සාමාන්‍යයෙන් ගිණුම් ප්‍රකාශනය ලැබෙන දින සිට දින 10කට පසුවද ගිණුම් ප්‍රකාශය නොලැබුණි නම් කරුණාකර කාඩ්පත් මධ්‍යස්ථානය ඇමතීම මගින් ගෙවිය යුතු මුදල පරීක්ෂා කරවා ගන්න.

12.3 කාඩ්පත් ගිණුම සම්බන්ධයෙන් නිකුත් කරනු ලැබූ සෑම ගිණුම් ප්‍රකාශනයක්ම කාඩ්පත්හිමියා විසින් පරීක්ෂා කල යුතු අතර එහි කිසියම් දෝෂයක් පිලිබඳ චෝදනාවක් ඇත්නම්, ගිණුම් ප්‍රකාශනයේ සඳහන් දිනයේ සිට දින 14ක් ඇතුලත ඒ බව බැංකු කාඩ්පත් මධ්‍යස්ථානය වෙත දැනුම් දිය යුතුය. ඉහත සඳහන් කරන ලද පරිදි දින 14ක් ඇතුලතදී එවැනි දෝෂයක් පිලිබඳ බැංකුව දැනුවත් කිරීමට කාඩ්පත්හිමියා අපොහොසත් වුව හොත් හෝ නොසකලකා හැරියහොත්, එම ගිණුම් ප්‍රකාශනය සහ එහි සියලුම ඇතුලත් කිරීම් කාඩ්පත්හිමියා සමග බැඳී පවතින අතර එම අන්තර්ගතය පිලිබඳ නිශ්චිත සාධකයක් ලෙස සලකනු ලැබේ. එමෙන්ම ඉන් අනතුරුව කාඩ්පත්හිමියා විසින් අදාළ ගිණුම් ප්‍රකාශනයෙහි අන්තර්ගතය පිලිබඳ තර්ක කිරීමද නොකළ යුතුය. ප්‍රාථමික කාඩ්පත්හිමියා විසින් බැංකුව වෙත ලිඛිතව දැනුම් දී ඇති නවතම ලිපිනය වෙත සියලුම ගිණුම් ප්‍රකාශයන් සාමාන්‍ය තැපැල මගින් එවනු ලබන අතර තැපැල් කල දින සිට පැය 48ක් ඇතුලත එය කාඩ්පත්හිමියා වෙත ලැබුණු බවට සලකනු ලැබේ. කාඩ්පත් ගිණුම සම්බන්ධව ඇති ඕනෑම පැමිණිල්ලක් කාඩ්පත්හිමියා විසින් දුරකථන මාර්ගයෙන් +94 117 640 640 හරහා හෝ කලින් කලට බැංකුව විසින් නියම කරනු ලබන සහ වෙබ් අඩවියෙහි සඳහන් කරනු ලබන වෙනත් ඕනෑම අංකයක් හරහා කාඩ්පත් මධ්‍යස්ථානය වෙත දැනුම් දිය යුතුය.

12.4 පෙර ගිණුම් ප්‍රකාශනයේ දිනයේ සිට වර්තමාන ගිණුම් ප්‍රකාශනයේ දිනයේදී බැංකු ගනුදෙනු අවසන් කරන මොහොත දක්වා කාඩ්පත් ගිණුමට සම්බන්ධව ලැබුණු හා සකස් කරනු ලැබූ සියලුම කාඩ්පත් ගනුදෙනු වල විස්තර ගිණුම් ප්‍රකාශයෙහි ඇතුලත් වේ.

12.5 ගිණුම් ප්‍රකාශනයෙහි සඳහන් හිඟ මුදල පහත කරුණු මත සකස් කරනු ලැබේ.

12.5.1 කාඩ්පත්හිමියා හෝ ඕනෑම පරිපූරක කාඩ්පත්හිමියෙකු (කාඩ්පත්හිමියන්) විසින් කාඩ්පත් ගිණුම මගින් අය කර ගැනීමට අවසර ලබා දෙමින් තැපැල් හා දුරකථන මාර්ග භාවිතයෙන් සිදු කරනු ලැබූ අනවුම්ද ඇතුලත්ව කාඩ්පත භාවිතයෙන් මිලදී ගනු ලැබූ සියලුම භාණ්ඩ හා සේවාවන්හි මිල.

12.5.2 ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATM's) හරහා සිදු කරනු ලැබූ ඒවාද ඇතුලත්ව කාඩ්පත් ගිණුම මත ලබා ගත් මුදල් අත්තිකාරම්.

12.5.3 දැනට පවතින රජයේ බදු සහ ක්‍රෙඩිට් කාඩ්පත භාවිතය නිසාවෙන් අය වන පොලියද ඇතුළුව වෙනත් සියලුම බැංකු ගාස්තුද ඇතුලත්ව ක්‍රෙඩිට් කාඩ්පත් භාවිතය පිලිබඳ කොන්දේසි හා නියමයන් ලෙස (උදා:- ගාස්තු, සේවා ගාස්තු ආදිය) පහත 13 වගන්තිය යටතේ දක්වා ඇති ගාස්තු (ගෙවීම් හා ගාස්තු)

13. ගෙවීම් හා ගාස්තු

මෙම කොටසෙහි සඳහන් වර්තමානයේ පවතින අයකිරීම් හා ගාස්තු පිලිබඳ විස්තර, බැංකුව විසින් ප්‍රකාශයට පත් කරනු ලබන සේවා හා මිල ගණන් පිලිබඳ මාර්ගෝපදේශයෙහි සඳහන් කර ඇති අතර එහි පිටපත්, ඉල්ලුම් කිරීම මගින් ලබා ගත හැක. කලින් කලට පෙර දැනුම්දීමකින් පසුව මෙම ගාස්තු වෙනස් විය හැක.

13.1 කාඩ්පත සඳහා සහ පරිපූරක කාඩ්පතක් නිකුත් කරනු ලබන අවස්ථාවේදී ඒ සඳහා බැංකුව විසින් නියම කරනු ලබන පරිදි සම්බන්ධ වීමේ ගාස්තුවක් හා වාර්ෂික ගාස්තුවක් (බැංකුවේ ඉල්ලීම මත) බැංකුව වෙත ගෙවීමට කාඩ්පත්හිමියා එකඟ වේ. කාඩ්පත අවලංගු කළහොත් හෝ එය පිළිනොගතහොත්, ගෙවනු ලැබූ වාර්ෂික ගාස්තුව නැවත ලබා දීමක් සිදු නොවේ.

13.2 ගිණුම් ප්‍රකාශනයෙහි වර්තමාන ශේෂය ලෙස දක්වා විස්තර කර ඇති, ගිණුම් ප්‍රකාශනයෙහි සඳහන් කර ඇති දිනයට පෙර ගෙවිය යුතු මුළු හිඟ මුදල වන සියලුම ගාස්තු වල මුළු මුදල ගෙවීමට කාඩ්පත්හිමියා එකඟ වන අතර ගෙවීම් සඳහා ලබා දී ඇති දිනයේදී හෝ ඊට පෙර වර්තමාන ශේෂය සඳහා වන ගෙවීම බැංකුව වෙත ලැබුන හොත් කාඩ්පත්හිමියා හට කිසිඳු මූල්‍ය ගාස්තුවක් (මුදල් අත්තිකාරම් හැර) දැරීමට සිදු නොවනු ඇත.

13.3 කාඩ්පත්හිමියා විසින් අදාළ ගෙවීම් සිදු කල යුතු දිනට පෙර මුළු හිඟ මුදල ගෙවීම සිදු නොකළ හොත්, බැංකුව විසින් තීරණය කරනු ලබන අනුපාතයක් යටතේ ගිණුම් ප්‍රකාශනයේ ශේෂය මත, වර්තමාන ගිණුම් ප්‍රකාශන මාසයෙහි පළමු දිනයේ සිට මීළඟ ගිණුම් ප්‍රකාශනය

නිකුත් කරනු ලබන දිනය දක්වා දෛනිකව ගණනය කර පොළී මුදලක් අයකරනු ඇත. ඉහත සඳහන් කාල සීමාව ඇතුලත ලැබුණු බිල්පත්, පොලිය ගණනය කිරීම සඳහා සැලකිල්ලට ගනු නොලැබේ. කෙසේ වුවද, සිදු කරනු ලබන ගෙවීම් මේ සඳහා සැලකිල්ලට ගනු ඇත.

13.4 බැංකුව විසින් කලින් කලට තීරණය කරනු ලබන මාසික අනුපාතයක් යටතේ පොලිය අය කරනු ඇත. පොලිය අය කිරීම සඳහා පොදු ක්‍රියාපටිපාටිය වන්නේ කාඩ්පත් ගිණුම වෙත යම් ගෙවීමක් සිදු කල විට, එම ගෙවීම සිදු කරනු ලබන දිනය දක්වා සම්පූර්ණ හර ශේෂය මත පොලිය අය කරනු ලැබීමයි. මෙලෙස, කොටස් වශයෙන් සිදු කරනු ලබන ගෙවීමකදී එවැනි ගෙවීමක් සිදු කරනු ලබන දිනය දක්වා හිඟ ශේෂය මත සහ ඉන් අනතුරුව ගිණුම් ප්‍රකාශනය ජනනය කරනු ලබන දිනය වන විට තවමත් ශේෂයක් පවතීනම්, එම දිනය දක්වා හිඟ මුදල් ප්‍රමාණය මත පොලිය අයකරනු ලැබේ.

13.5 කාඩ්පත් ගිණුම විවෘත කිරීමෙන් පසුව කාඩ්පත්හිමියා වෙත ලැබෙන පළමු ගිණුම් ප්‍රකාශයෙහි, එම ගිණුම විවෘත කල දිනයේ සිට ගිණුම් ප්‍රකාශනය ජනනය කල දිනය දක්වා සිදුකල ගනුදෙනු වල විස්තර සහ හිඟ ගාස්තු ප්‍රමාණය ඇතුලත් වනු ඇත. පොලියක් අය කරනු ලබන අවස්ථාවක් වන මුදල් අත්තිකාරමක් ලබා ගත් අවස්ථාවකදී හැර මෙම ගිණුම් ප්‍රකාශනයෙහි කිසිදු පොලී මුදලක් දක්වනු නොලැබේ. ගෙවීම් සිදු කල යුතු දිනයේදී හෝ ඊට පෙර ගෙවිය යුතු මුදල සම්පුර්ණයෙන් ගෙවනු ලැබුවහොත් කිසිඳු පොලී මුදලක් අය නොවේ.

13.6 සම්පූර්ණ හිඟ මුදල නොගෙවා, ගෙවිය යුතු අවම මුදල හෝ අවම මුදලට වැඩි ඕනෑම මුදල් ප්‍රමාණයක් ගෙවනු ලැබූ අවස්ථා වලදී පොළී මුදලක් අය කරනු ඇත. ඊළඟ බිල්පත් කාලපරිච්ඡේදය සඳහා වන ගිණුම් ප්‍රකාශනය තුල ගෙවිය යුතු පොලී ප්‍රමාණය සඳහන් වේ. එහෙත් එම බිල්පත් කාලපරිච්ඡේදය තුල සිදු කරන ගනුදෙනු සඳහා (මුදල් අත්තිකාරම් හැර) එම අවස්ථාවේදී පොලියක් අය නොවේ.

13.7 මේ අනුව, ගිණුම් ප්‍රකාශනයෙහි සඳහන් කර ඇති මුදල සම්පූර්ණයෙන් ගෙවනු ලබන කාඩ්පත්හිමියා, තම ගනුදෙනු සඳහා (මුදල් අත්තිකාරම් හැර) පොලී ගෙවීමෙන් නිදහස් වේ.

13.8 මුදල් අත්තිකාරම් සඳහා පොලිය, මුදල් ලබා ගත දිනයේ සිට එය සම්පූර්ණයෙන් ගෙවා අවසන් වන දිනය දක්වා අය කෙරේ.

13.9 ගෙවීම් සඳහා ලබා දී ඇති දිනයේ හෝ ඊට පෙර, ගෙවිය යුතු අවම හිඟ මුදල ගෙවා නොමැතිනම්, ඒ සඳහා පොලියට අමතරව කලින් කලට පවතින ප්‍රමාද වී ගෙවීමේ ගාස්තුවක් ගෙවීමට කාඩ්පත්හිමියා බැඳී සිටී.

13.10 බැංකුව විසින් කලින් කලට තීරණය කරනු ලබන අනුපාත වලට යටත්ව අදාළ අවස්ථාවන්හිදී ගාස්තු හා අයකිරීම් ගෙවීමට කාඩ්පත්හිමියා එකඟ වේ.

13.11 කාඩ්පත්හිමියා විසින් අදාළ ගෙවීම් සඳහා ලබා දී ඇති දිනය වන විට වර්තමාන ශේෂ මුදල ගෙවා නොමැති නම්, කාඩ්පත් ගිණුම වෙත ගෙවීම් ලැබෙන තෙක් සහ ඉන් අනතුරුව අඩු

කරන ලද ශේෂය මත දෛනිකව ගණනය කරන ලද මූල්‍ය ගාස්තුවක් වර්තමාන ශේෂය වෙත එකතු වේ.

13.12 කාඩ්පත්හිමියා වෙතින් බැංකුව වෙත ලැබුණු සියලුම ගෙවීම්, පහත දැක්වෙන ගෙවීම් අනුපිලිවෙලට හෝ සුදුසු යැයි බැංකුව විසින් තීරණය කරනු ලබන වෙනත් අනුපිළිවෙලකට අදාළ වනු ඇත.

13.12.1 පෙර ගිණුම් ප්‍රකාශනයන්හි දක්වා ඇති සියලුම නොගෙවූ මූල්‍ය ගාස්තු, සේවා ගාස්තු, අය කිරීම්, මුදල් අත්තිකාරම් සහ ඕනෑම අනෙකුත් පිරිවැය

13.12.2 වර්තමාන ගිණුම් ප්‍රකාශනයන්හි දක්වා ඇති සියලුම නොගෙවූ මූල්‍ය ගාස්තු, සේවා ගාස්තු, අය කිරීම්, මුදල් අත්තිකාරම් සහ අනෙකුත් පිරිවැය

13.12.3 පෙර ගිණුම් ප්‍රකාශනයන්හි දක්වා ඇති සියලුම නොගෙවූ කාඩ්පත් ගනුදෙනු හා මිලදී ගැනීම් ගනුදෙනු

13.12.4 වර්තමාන ගිණුම් ප්‍රකාශනයන්හි දක්වා ඇති සියලුම නොගෙවූ කාඩ්පත් ගනුදෙනු හා මිලදී ගැනීම් ගනුදෙනු

13.12.5 වර්තමාන ගිණුම් ප්‍රකාශනයන්හි තවමත් දක්වා නොමැති සියලුම නොගෙවූ මූල්‍ය ගාස්තු, සේවා ගාස්තු, අය කිරීම්, මුදල් අත්තිකාරම් සහ අනෙකුත් පිරිවැය

13.13 පොළී අනුපාත ක්‍රමය හෝ වාර්ෂික ගාස්තු, මෙහෙයුම් ගාස්තු, අමතර ගාස්තු, මූල්‍ය ගාස්තු, ගෙවිය යුතු නියමිත අවම මුදල සහ / හෝ ප්‍රමාද වී ගෙවීම් ගාස්තු හෝ වෙනත් ඕනෑම ගාස්තුවක් ගණනය කරනු ලබන ආකාරය සිය තනි අභිමතය පරිදි වෙනස් කිරීම සඳහා අයිතිය බැංකුව සතු වේ.

13.14 ආදේශන කාඩ්පතක් නිකුත් කරන ලෙස ඉල්ලීමක් කල වහාම බැංකුව විසින් නියම කරන පරිදි ආදේශන ගාස්තුවක් කාඩ්පත්හිමියා විසින් බැංකුව වෙත ගෙවිය යුතුය. විකුණුම් වවුචර් පිටපත් සැපයීම, මුදල් අත්තිකාරම් ස්ලිප් පත්, බැංකුව විසින් කලින් කලට තවදුරටත් ලබා දෙනු ලබන වෙනත් සේවාවන් සඳහා බැංකුව වෙත ඉල්ලුම් කල වහාම බැංකුව විසින් නියම කරනු ලබන පරිදි අමතර ගාස්තු කාඩ්පත්හිමියා විසින් බැංකුව වෙත ගෙවිය යුතුය.

13.15 ඕනෑම අවස්ථාවකදී සුදුසු නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ඇති අයිතියට අගතියක් නොමැතිව, හිඟ මුදල වෙනුවෙන් සම්පූර්ණ ගෙවීමක් ලෙස හෝ කොටසක් ලෙස කාඩ්පත්හිමියා විසින් ලබා දුන් ඕනෑම ආපසු හරවා යැවූ ගෙවීම් සිදු නොකළ චෙක්පත් සඳහා බැංකුව විසින් ගාස්තුවක් අය කරනු ඇත.

13.16 කාඩ්පත් ගිණුම යටතේ ඕනෑම මොහොතකදී කාඩ්පත්හිමියා විසින් බැංකුව වෙත යම් මුදලක් හිඟව පවතීනම් හෝ ඕනෑම බැංකු ගිණුමක්, හෝ ජංගම හෝ එසේ නොවන වෙනත් ඕනෑම ගිණුමක් ඕනෑම ආකාරයකින් හෝ එවැනි ගිණුම් වල විධිවිධාන යටතේ හෝ බැංකුව විසින් කාඩ්පත්හිමියා වෙත ලබා දෙනු ලබන වෙනත් ඕනෑම බැංකු පහසුකමක් යටතේ කාඩ්පත්හිමියා විසින් යම් පැහැරහැරීමක් සිදු වුවහොත්, එවැනි අවස්ථා වලදී කාඩ්පත් ගිණුමෙහි (ගිණුම්වල) ඇති මුළු හිඟ ශේෂය වහාම ගෙවිය යුතු බවට පත් වන බවටත් 19වන වගන්තියෙහි විධිවිධානයන් (අවසන් කිරීම) එම අවස්ථාවේදී අදාළ වන බවටත් කාඩ්පත්හිමියා විසින් විශේෂයෙන්ම මෙයින් එකඟ වේ.

13.17 කාඩ්පත් ගිණුමෙහි ඇති ශේෂය සඳහන් කරමින් බැංකු නිලධාරියෙකු විසින් අත්සන් කරන ලද සහතිකය, එම සහතිකයෙහි සඳහන් දිනයේදී කාඩ්පත්හිමියා විසින් බැංකුව වෙත ඇති වගකීම පිලිබඳ ප්‍රාමාණික සාක්ෂියක් වනු ඇත.

13.18 ඕනෑම මුදල් තැන්පතුවක් බැංකුව වෙත ලැබුණු බවට සලකනු ලබන්නේ එය කාඩ්පත් ගිණුම වෙත බැර වීමෙන් පසුව පමණි.

13.19 ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර හා චෙක්පත් තැන්පතු පෙට්ටි හරහා සිදු කරනු ලබන චෙක්පත් තැන්පතු එකතු කර ගනු ලබන්නේ මීළඟ වැඩ කරන දිනයේදීය.

13.20 බැංකු ශාඛාවක් පිහිටා නොමැති ස්ථානයක් යටතේ ලියන ලද චෙක්පත් මගින් සිදු කරනු ලබන ගෙවීම්, බැංකුව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි සැකසුම් හා මෙහෙයුම් ගාස්තුවකට යටත් වනු ඇත

13.21 කාඩ්පත්හිමියා විසින් ක්‍රෙඩිට් කාඩ් බිල්පතෙහි හිඟ මුදලින් යම් ප්‍රතිශතයක් ගෙවීම් සිදු කල යුතු දිනයේදී කාඩ්පත් ගිණුම වෙත ගෙවීම සඳහා කාඩ්පත්හිමියාගේ බැංකුව සමග පවතින ඉතුරුම් හෝ ජංගම ගිණුම් වෙත ඍජු හර ස්ථාවර නියෝගයක් නිකුත්කල හැක. එවැනි ඕනෑම ස්ථාවර නියෝගයක් සඳහා සිදු කරනු ලබන ඕනෑම වෙනස් කිරීමක් හෝ අවලංගු කිරීමක්, මීළඟ හිඟ මුදල් ගෙවීමේ දිනයට අවම වශයෙන් සති දෙකකට හෝ පෙර බැංකුව වෙත ලබා දිය යුතු බවට කාඩ්පත්හිමියා විසින් එකඟ වේ.

13.22 නියම කරනු ලැබූ බැංකුව සමග ඇති පියවීමේ ගිණුම වෙත ලබා දුන් ඍජු හර ස්ථාවර නියෝගයක් සඳහා පහත දක්වා ඇති අමතර කොන්දේසි හා නියමයන් අදාළ වේ.

I. ඉදිරිපත් කරන ලද චෙක් පත් වලට එරෙහිව එවන් ස්ථාවර නියෝගයක් හෝ බැංකුව සමග ඇති කරගත් වෙනත් ඕනෑම විධිවිධානයක් පිලිබඳ ප්‍රමුඛතාවය තීරණය කිරීමේ අයිතිය බැංකුව සතු වන බවට කාඩ්පත්හිමියා විසින් එකඟ වේ.

II. ස්ථාවර නියෝග සපුරාලීම සඳහා අවශ්‍ය මුදල් ප්‍රමාණය ගෙවීම් සිදු කල යුතු දිනට පෙර දින අදාළ පියවීමේ ගිණුමෙහි පවත්වා ගැනීමට කාඩ්පත්හිමියා එකඟ වේ. පියවීමේ ගිණුමෙහි අවශ්‍ය මුදල් ප්‍රමාණය නොමැති අවස්ථාවකදී, බැංකුව කලින් කලට සිය තනි අභිමතය පරිදි ස්ථාවර නියෝගයට අදාළ ගෙවීම සිදු කිරීම සඳහා මුදල් අයිරාවක් ලබා දීමට කටයුතු කරනු ඇත. අවශ්‍ය අවස්ථාවේදී කලින් කලට බැංකුව විසින් තීරණය කරනු ලබන අනුපාතිකයකට යටත්ව අදාළ අවස්ථාවට අනුව අය කරන මූල්‍ය ගාස්තුද ඇතුළුව ඊට අදාළ සියලු ගාස්තු, අයකිරීම් හා බදු සමග සියලු හිඟ මුදල් නැවත පියවීමට කාඩ්පත්හිමියා බැඳී සිටී.

III. ගිණුම් ප්‍රකාශනයේ දිනය හා ගෙවීම් සිදු කිරීමට ලබා දී ඇති දිනය අතර සිදු කරනු ලබන ගෙවීම්, බැංකුව සමග ඇති පියවීමේ ගිණුමට ලබා දී ඇති ඍජු ස්ථාවර නියෝග ගණනය කිරීමේදී සැලකිල්ලට ගනු නොලබන බවට කාඩ්පත්හිමියා එකඟවේ.

IV. ස්ථාවර නියෝගය ක්‍රියාත්මක කිරීම සඳහා පියවීමේ ගිණුමෙහි අවශ්‍ය මුදල් ප්‍රමාණය නොමැති අවස්ථාවකදී, ගෙවිය යුතු මුදලෙන් කොටසක් ගෙවා හෝ අය කරගෙන තිබුනද, බැංකුව විසින් රු. 250/- ක ස්වයංක්‍රීයව අය වන ප්‍රතික්ෂේප වීමේ ගාස්තුවක් අය කරනු ඇත. එකී ගාස්තුව බැංකුවෙහි අභිමතය පරිදි කලින් කලට වෙනස් වනු ඇත. ඔබ විසින් ලබා දෙනු ලැබූ ස්ථාවර නියෝගය ක්‍රියාත්මක කිරීම සඳහා පියවීමේ ගිණුමෙහි අවශ්‍ය මුදල් ප්‍රමාණය අඛණ්ඩව නොමැති වුවහොත්, එම ස්ථාවර නියෝග උපදෙස් අවලංගු වනු ඇත.

13.23 කාඩ්පත්හිමියා විසින් කාඩ්පත් ගිණුම නමින් බැංකුව වෙත සිදු කරනු ලැබූ ගෙවීම් කලින් කලට බැංකුව විසින් සුදුසු යැයි සිතන අනුපිලිවෙලට, මෙම කොන්දේසි හා නියමයන් යටතේ කාඩ්පත්හිමියාගේ වගකීම් වෙනුවෙන් හෝ වගකීම් වෙත ගෙවීම සඳහා අය කර ගනු ලැබේ.

13.24 කාඩ්පත්හිමියා විසින් සිදු කරනු ලබන ගෙවීම්, සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලදී බැංකුව වෙත සිදු කල බවට සලකනු ලබන්නේ එම ගෙවීම් බැංකුව වෙත ලැබුණු දිනයේ සිට වන අතර ගිණුම් ප්‍රකාශනයේ සඳහන් තැපැල් කරනු ලැබූ දිනයේ සිට නොවේ. සිදු කරනු ලබන ගෙවීම් කාඩ්පත් ගිණුම වෙත බැර කිරීමට අවම වශයෙන් දින 3-4 ක් ලබා දිය යුතුය.

13.25 කාඩ්පත්හිමියා විසින් සිදු කරනු ලබන සියලුම ගෙවීම්, කාඩ්පත් ගිණුමෙහි බිල්පත් කරනු ලබන මුදල් ඒකකයෙන් ගෙවිය යුතුය. වෙනත් මුදල් ඒකකයක් මගින් ගෙවීම් සිදු කල හොත්, එවැනි මුදල් ඒකක පරිවර්තනය කිරීමකදී බැංකුව විසින් අය කරන හෝ දැරීමට සිදු වන සියලුම විනිමය කොමිස් සහ වෙනත් ගාස්තු හෝ අලාභයන් කාඩ්පත්හිමියා විසින් බැංකුව වෙත ගෙවිය යුතුය. අදාළ ගෙවීම කාඩ්පත් ගිණුම වෙත ඇතුලු කරන දිනයේදී බැංකුවෙහි තනි අභිමතය පරිදි තීරණය කරනු ලබන හුවමාරු අනුපාතිකයක් යටතේ මුදල් ඒකක පරිවර්තනය සිදු වනු ඇත.

කාඩ්පත්හිමියා විසින් කාඩ්පත් ගිණුමෙහි බිල්පත් කරනු ලබන මුදල් ඒකකයෙන් සිදු කරනු ලබන ඕනෑම ගෙවීමක්, කාඩ්පත් ගිණුම වෙත බැර වන්නේ කාඩ්පත් ගිණුම වෙත බැංකුව මගින් මුදල් තැන්පත් කරනු ලබන දිනයේදී වන අතර කාඩ්පත් ගිණුම වෙත බිල්පත් කරනු ලබන මුදල් ඒකකයෙන් හැර වෙනත් ඕනෑම මුදල් ඒකකයකින් ගෙවීම් ලැබුණු අවස්ථාවකදී, එවැනි ගෙවීම් කාඩ්පත් ගිණුම වෙත බැර වන්නේ එම ගෙවීම අදාළ බිල්පත් කරනු ලබන මුදල් ඒකකය වෙත පරිවර්තනය වූ දිනයට පසුව හෝ අදාළ මුදල් වල වටිනාකම ගණනය කිරීම සඳහා බැංකුව වෙත ලැබී, එය තැන්පත් කරනු ලබන දිනයේදීය.

13.26 ගිවිසුමෙහි අනෙකුත් විධිවිධාන වලට අගතියකින් තොරව, කාඩ්පත්හිමියා මසකට වැඩි කාල සීමාවක් ශ්‍රී ලංකාවෙන් පිටත රැඳී සිටියහොත්, කාඩ්පත් ගිණුම පියවීම සඳහා අවශ්‍ය පැහැදිලි හා නිශ්චිත උපදෙස් කාඩ්පත්හිමියා විසින් ලබා දී ඔහු/ඇය රටින් පිටත් වීමට පෙර බැංකු කාඩ්පත් මධ්‍යස්ථානය වෙත එම උපදෙස් දන්වා සිටිය යුතුය. ඒ පිළිබඳ නිසි පරිදි දැනුම් දී නොමැති නම්, සිය තනි අභිමතය පරිදි කාඩ්පත් අවලංගු කිරීමේ අයිතිය බැංකුව සතු වේ.

13.27 ගිණුම් ප්‍රකාශනය නොලැබීම, කාඩ්පත්හිමියා හට අදාළ හිඟ මුදල් ගෙවිය යුතු දිනට එය පියවීමෙන් වැලකී සිටීම සඳහා ප්‍රමාණයවත් හේතුවක් නොවන බව තේරුම් ගත යුතුය. නොසිතනු ලබන හේතුන් නිසාවෙන් හෝ බැංකුවෙහි පාලනයෙන් බැහැර හේතුන් නිසාවෙන් හෝ ගිණුම් ප්‍රකාශනය නොලැබීම සඳහා වගකීම බැංකුව විසින් දැරීමට නොහැකි වේ.

13.28 කාඩ්පත්හිමියා තම පදිංචි නගරයෙන් පිටතට යන්නේ නම්, හිඟ මුදල් පියවිය යුතු දිනයේදී හෝ ඊට පෙර අවම වශයෙන් ගෙවිය යුතු අවම හිඟ මුදල හෝ බැංකුව වෙත ගෙවීමට අවශ්‍ය විධිවිධාන සැලසීම කාඩ්පත්හිමියා සතු වගකීමක් වනු ඇත.

13.29 ඕනෑම නැවත ගෙවීමක් බැංකුව විසින් කාඩ්පත් ගිණුම වෙත බැර කරනු ලබන්නේ සාමාජික ආයතන මගින් නිසි පරිදි නිකුත් කරන ලද බැර වවුචරයක් බැංකුව වෙත ලැබුණු පසුවය.

13.30 කාඩ්පත්හිමියා විසින් ඕනෑම ගිණුම් ප්‍රකාශනයක් නමින් බැංකුව වෙත සිදු කරනු ලබන ඕනෑම අගයක ගෙවීමක් මගින් එම ගිණුම් ප්‍රකාශනයෙහි පෙන්වා ඇති සියලුම ඇතුලත් කිරීම් කාඩ්පත්හිමියා විසින් පිළිගත් බවට නිශ්චිත සාක්ෂයක් මෙන්ම ඒ වෙනුවෙන් බැඳී සිටින බවටද සලකනු ලැබේ.

13.31 මෙම ගිවිසුමට අනුව නීතිය විසින් නියම කරනු ලබන අඩු කිරීමකදී හෝ රඳවා ගැනීමකදී හැර, කාඩ්පත්හිමියා විසින් කිසිදු අඩු කිරීමක් හෝ රඳවා ගැනීමකින් තොරව (හිලව් කිරීමක්, ප්‍රතියාචනයක්, බදු, ගාස්තු හෝ වෙනත් ආකාරයක් වෙනුවෙන්) සියලුම මුදල් සම්පූර්ණ වශයෙන් බැංකුව වෙත ගෙවිය යුතුය.නීතිය විසින් යම් අඩු කිරීමක් හෝ රඳවා ගැනීමක් නියම කල හොත්, කාඩ්පත්හිමියා විසින් වහාම බැංකුව වෙත අමතර මුදල ගෙවිය යුතු අතර එමගින් එවැනි අඩු

කිරීමක් හෝ රඳවා ගැනීමක් සිදු නොවුනිනම් අප වෙත ලැබිය යුතු මුළු මුදලට සමාන මුදලක් ලැබෙන අතර අඩු කල හෝ රඳවා ගත් සියලුම මුදල් සඳහා අදාළ නිලධාරියෙකු විසින් ලබාදෙන නිල රිසිට්පතක් ඔබ විසින් සපයා දිය යුතුය.

13 (b) වාරික ගෙවීම්

වාරික වශයෙන් ගෙවීම සඳහා භාණ්ඩ හෝ සේවාවන් ලබා ගැනීමට ඔබ තීරණය කරනු ලැබූ අවස්ථාවකදී ඔබගේ කාඩ්පතෙහි භාවිතා කිරීමට ඉතිරිව පවතින ණය මුදලින් මිලදී ගත් භාණ්ඩ හෝ සේවාවන්ට අදාළ මුළු වටිනාකම අවහිර වනු ඇත.

13.32 වාරික මගින් ගෙවීම සඳහා හෝ වරින් වර ගෙවීම් සිදු කරන පදනමකින් භාණ්ඩ හෝ සේවාවන් මිලදී ගැනීම සඳහා ඔබ විසින් කාඩ්පත භාවිතා කල හොත් එම වාරික හිඟ වන අවස්ථා වලදී ඔබගේ කාඩ්පතෙහි දැනට පවතින ශේෂයට අනුව එය පියවීමට හැකියාව තිබේනම්,එය ඔබ වෙනුවෙන් ගෙවීමට ඔබ විසින් බලය පවරනු ලබන අතර එම එක් එක් වාරික මුදල කාඩ්පත් ගිණුමෙහි හිඟ බවට පත් වන අවස්ථාවේදී ඒවා පියවීමටද එකඟ වේ.

13.33 ඔබහට කාඩ්පත භාවිතා කිරීමට ඇති අයිතිය අත්හිටුවා ඇත්නම් හෝ ඔබගේ කාඩ්පත් ගිණුම අවලංගු කර ඇත්නම්, අප සතු විකල්පයන්ට අනුව හා අපගේ අයිතීන්ට හා පිළියම් වෙත පක්ෂපාතිත්වයකින් තොරව, වහාම දැනට ඉතිරිව පවතින වාරික වල මුළු මුදල බිල්පත් කරනු ඇත.

13.34 එමෙන්ම, වාරික ගෙවීම් ක්‍රම හා සම්බන්ධව ක්‍රියාත්මක වන වෙනත් ඕනෑම විශේෂිත කොන්දේසි හා නියමයන් වෙතද බැඳී සිටින බවට ඔබ විසින් එකඟ වේ.

14. **ව්‍යවස්ථාමය රෙගුලාසි**

14.1 කාඩ්පත (කාඩ්පත්) භාවිතා කිරීමෙන් බලපෑමට ලක් විය හැකි සහ එවැනි රෙගුලාසි වලට අනුකූල නොවීම හෝ කඩ කිරීම හේතුවෙන් බැංකුව විසින් දරන ලද ඕනෑම අලාභයක්, හිමිකමක් හෝ වියදමක් පියවීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව මගින් හෝ ඊට සමාන නියාමන අධිකාරියක් විසින් කලින් කලට නිකුත් කරනු ලබන සියලුම රෙගුලාසි වලට අනුකූල වීමට කාඩ්පත්හිමියා විසින් එකඟ වේ.

14.2 කාඩ්පත්හිමියා විසින් ප්‍රාග්ධන ගනුදෙනු සඳහා සහ වාණිජ ප්‍රමාණ වලින් භාණ්ඩ මිලදී ගැනීම / ආනයනය කිරීම සඳහා කාඩ්පත් භාවිතා නොකළ යුතුය.

14.3 ඉලෙක්ට්‍රොනික මුදල් හුවමාරු (EFT) හෝ ATM මගින් විදේශ මුදල් ඒකකයන්ගෙන් මුදල් ලබා ගැනීම සඳහා මෙම කාඩ්පත භාවිතා කරනු ලබන අවස්ථාවකදී, කලින් කලට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ නිකුත් කරන ලද හා වෙනත් නියාමන

බලධාරීන් විසින් නිකුත් කරනු ලබන රෙගුලාසි නියමයන්ට යටත් වන අතර එවැනි ක්‍රියාවන් සිදු කල හැක්කේ අවසරලත් අරමුණු සඳහා පමණි.

14.4 පුද්ගල විදේශ මුදල් ගිණුමකට (PFCA) හෝ ව්‍යාපාර විදේශ මුදල් ගිණුමකට (BFCA) බැරව ඇති මුදල් වලට එරෙහිව කාඩ්පත නිකුත් කර ඇති අවස්ථාවකදී සහ අභ්‍යන්තර ප්‍රේෂණ හෝ විදේශ මුදල් ගිණුම් මගින් මුදල් හුවමාරු කිරීම හරහා හිඟ මුදල් පියවනු ලබන පදනමක ක්‍රියා කරන අවස්ථාවකදී හැර කාඩ්පත්හිමියා වෙනත් රටකට සංක්‍රමණය වුවහොත් හෝ රැකියාවක් සඳහා විදෙස් ගත වුව හොත්, කාඩ්පත් බැංකුව වෙත නැවත භාර දිය යුතුය යන කොන්දේසියට අනුව කාඩ්පත නිකුත් කරනු ලැබේ.

14.5 වරින් වර නියම කරනු ලබන විදේශ විනිමය හෝ වෙනත් නියාමන අධිකාරීන්හි අධ්‍යක්ෂකවරයාගේ අවශ්‍යතාවයන්ට අනුකූලව බැංකුව කටයුතු කරන අතර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පවතින නීති හා රෙගුලාසි යටතේ අදාළ බලධාරීන් වෙත එවැනි ගනුදෙනු පිලිබඳ විස්තර හෙළිදරව් කරනු ඇත.

14.6 විදේශ විනිමය රෙගුලාසි හෝ එම අවස්ථාවේදී ක්‍රියාත්මක වන වෙනත් ඕනෑම ව්‍යවස්ථාපිත රෙගුලාසි උල්ලංඝනය වී ඇති බවට විශ්වාස කිරීමට හැකිවන අකාරයේ කුමන හෝ ඕනෑම හේතුවක් බැංකුව සතු වන අවස්ථාවකදී, කාඩ්පත්හිමියා (කාඩ්පත්හිමියන්) වෙත පෙර දැනුම් දීමකින් තොරව බැංකුව සිය තනි එකඟතාවයට අනුව කාඩ්පත අවලංගු කරනු ඇත.

15. නැවත අයකරවා ගැනීම

කාඩ්පත් ගිණුම මගින් බැංකුව වෙත හිඟව පවතින මුදල් ගෙවීම වෙනුවෙන් බැංකුවහට ඕනෑම අවස්ථාවකදී හා දැනුම්දීමකින් තොරව වගකීම් පියවීම හෝ කාඩ්පත්හිමියාගේ ඕනෑම ගිණුමක්/ගිණුම් වෙත බැරව පවතින ඕනෑම මුදලක් හුවමාරු කිරීම සිදු කල හැක.

ණය ආපසු ගෙවීම පැහැරහැරිම සම්බන්ධයෙන් පාරිභෝගිකයා ප්‍රතිචාරාත්මක හෝ සංගත නොවන අවස්ථාවකදී, පාරිභෝගිකයන් විසින් බැංකුව වෙත ලබා දී ඇති ඔහුගේ / ඇයගේ තැපැල් ලිපිනය හෝ ස්ථිර පදිංචි ලිපිනය වෙත පැමිණීම සඳහා සිය ප්‍රතිසාධන / එකතු කිරීමේ කාර්ය මණ්ඩලය (අවසරලත් බාහිර පාර්ශවික එකතු කිරීමේ ඒජන්සි / නියෝජිතයන් ඇතුලත් විය හැක.) යෙදවීමේ අයිතිය බැංකුව සතුය.

16. කාඩ්පතෙහි වලංගුභාවය, කල් ඉකුත්වීම හා නැවත අලුත් කිරීම

16.1 සියලුම කාඩ්පත් සාමාන්‍යයෙන් වසරක වලංගු කාලයක් සඳහා නිකුත් කෙරේ. බැංකුව සිය තනි අභිමතය පරිදි වසරකට වැඩි වලංගු කාලසීමා සඳහා කාඩ්පත් නිකුත් කරනු ඇත. කාඩ්පතෙහි සඳහන් කර ඇති අවලංගු වන දිනයේදී ඔබගේ කාඩ්පතෙහි වලංගුභාවය අවලංගු වනු ඇත.

16.2 අදාළ කොන්දේසි හා නියමයන් උල්ලංඝනය වීමක් සිදු නොවුනහොත්, බැංකුව විසින් ස්වයංක්‍රීයව ඔබගේ (පරිපූරක කාඩ්පතෙහි වලංගුභාවයද ඇතුළුව) කාඩ්පතෙහි වලංගුභාවය නැවත අලුත් කරනු ඇති අතර දැනට පවතින කාඩ්පත (කාඩ්පත්) අවලංගු වීමට සාමාන්‍යයෙන් දින 15කට පෙර ඔබ වෙත නව කාඩ්පත (කාඩ්පත්) ලැබීමට සලස්වනු ඇත. නියමිත කාලයට ප්‍රථම ඔබගේ නව කාඩ්පත (කාඩ්පත්) නොලැබුණහොත්, කරුණාකර බැංකුවෙහි කාඩ්පත් සේවා අංශය අමතන්න.

16.3 මාසයක් හෝ ඊට වැඩි කාල සීමාවක් කිසිඳු ගෙවීමක් නියමිත කාලයේදී නොගෙවා පැහැරහැර නොමැති නම්, කාඩ්පත ස්වයංක්‍රීයව අලුත් වනු ඇත. තම කාඩ්පත හෝ ඕනෑම පරිපූරක කාඩ්පතක් අලුත් කර ගැනීමට කාඩ්පත්හිමියාට අවශ්‍ය නොමැති නම්, කාඩ්පත අලුත් කරනු ලබන දිනට මාස දෙකකට ප්‍රථම බැංකුවෙහි කාඩ්පත් සේවා අංශය වෙත ඒ බව ලිඛිතව දැනුම් දිය යුතුය. කල් ඉකුත්වීමට මාස දෙකකට පෙර හෝ දින 30කට අඩු කාලයකදී කරනු ලබන දැනුම්දීම් පිළිගත නොහැක. එසේ දැනුම් දීමක් නොලැබුණු අවස්ථාවකදී, කාඩ්පත අලුත් කිරීම සඳහා ගාස්තුවක් (අලුත් කරනු ලබන කාල සීමාවට අදාලව) අය කරනු ඇති අතර එම ගාස්තුව නැවත බැර කිරීමක් සිදු කරනු නොලැබේ.

16.4 වලංගු කාලසීමාවෙන් පසුව කාඩ්පත්හිමියා විසින් එම කාඩ්පත භාවිතා කිරීමට උත්සාහ නොගත යුතුය. වලංගු කාල සීමාවෙන් පිටතදී කාඩ්පත භාවිතා කිරීමට උත්සාහ කිරීමෙන් හට ගනු ලබන ඕනෑම ප්‍රතිවිපාකයක් සඳහා කුමන හෝ ආකාරයක වගකීමක් බැංකුව විසින් දරනු නොලැබේ.

17. **කාඩ්පත්හිමියා සහ වෙළඳ ස්ථාන අතර මතභේද**

17.1 ඕනෑම වෙළඳ ආයතනයක් / මූල්‍ය ආයතනයක් සම්බන්ධයෙන් ඕනෑම මතභේදයක් හෝ පැමිණිල්ලක් කාඩ්පත්හිමියා විසින් එම වෙළඳ ආයතනය / මූල්‍ය ආයතනය සමග කෙලින්ම විසඳා ගත යුතුය. ඕනෑම වෙළඳ ආයතනයක් හෝ මූල්‍ය ආයතනයක් මගින් කාඩ්පත්හිමියා හෝ පරිපූරක කාඩ්පත්හිමියා (කාඩ්පත්හිමියන්) විසින් ලබා ගනු ලබන ඕනෑම භාණ්ඩ හා සේවාවන්හි ගුණාත්මකභාවය හෝ වටිනාකම පිලිබඳ කිසිඳු ආකාරයක වගකීමක් බැංකුව විසින් දරනු නොලැබේ.

18. **මතභේද හා නැවත විසඳාගැනීම්**

18.1 ගිණුම් ප්‍රකාශනයෙහි යම් කිසි දෝෂයක් සිදුව ඇති බවට කාඩ්පත්හිමියා විශ්වාස කරයි නම් (අවම වශයෙන් ගිණුම් ප්‍රකාශනයෙහි දිනයේ සිට දින 30ක් ඇතුලත) වහාම බැංකුව වෙත දැනුම් දිය යුතුය. බැංකුව මගින් සිදු කරනු ලබන විමර්ශන සඳහා සහය වීමට, කාඩ්පත්හිමියා විසින් පහත සඳහන් විස්තර සැපයිය යුතුය ; නම සහ කාඩ්පත් අංකය, ගැටලුකාරී ගනුදෙනුවෙහි විස්තර, සැක කරනු ලබන දෝෂයට අදාළ මුදල

18.2 කාඩ්පත්හිමියා විසින් පැමිණිල්ල වාචිකව බැංකුව වෙත දැනුම්දුන්නේ නම්, වැඩ කරන දින 5ක් ඇතුලත කාඩ්පත්හිමියා විසින් එම පැමිණිල්ල පිලිබඳ ලිඛිතව බැංකුව වෙත ලබා දිය යුතුය. තව දුරටත් විස්තර අවශ්‍ය වන අවස්ථාවකදී බැංකුව විසින් කාඩ්පත්හිමියාව නැවත සම්බන්ධ කර ගනු ඇත.

18.3 බැංකුව විසින් විමර්ශන හා නිවැරදි කිරීම් (එසේ ඇත්නම්) සිදු කරමින් පවතින අවස්ථාවකදී, ඒ පිලිබඳ විසඳුමකට පැමිණෙන තෙක් බැංකුව විසින් සිය තනි අභිමතය පරිදි, මතභේදයට තුඩු දුන් ගනුදෙනුවට අදාළ මුදල් ප්‍රමාණය ගිණුම වෙත බැර කරනු ඇත. අදාළ විමර්ශන අවසානයේදී කිසිදු දෝෂයක් සිදුව නැති බවට බැංකුව විසින් අවසන් නිගමනයට පැමිණිය අවස්ථාවකදී බැංකුව විසින් වහාම ඒ පිලිබඳව කාඩ්පත්හිමියා දැනුවත් කරනු ඇත. එමෙන්ම මතභේදයට තුඩු දුන් ගනුදෙනුවට අදාළ මුදල් ප්‍රමාණය නැවත ගිණුම වෙත හර වනු ඇති අතර එම අවස්ථාවට අදාළ වන පරිදි සේවා ගාස්තුද අය වනු ඇත. කාඩ්පත්හිමියාගේ ගැටලුව පිලිබඳ විමර්ශනය කරනු ලබන ක්‍රියාවලියේදී බැංකුවෙහි ලේඛනාගාරයෙන් හෝ වෙනත් බැංකුවකින් වවුචර් පිටපත් ආදිය ලබා ගැනීමට බැංකුව හට සිදුවුනි නම්, ඊට අදාළ පරිදි එසේ ලබා ගැනීමට වැය වූ ගාස්තු කාඩ්පත්හිමියාගේ ගිණුමට හර කරනු ඇත.

19. අවලංගු කිරීම

19.1 ඉහත 13වන වගන්තිය (ගෙවීම් හා ගාස්තු) යටතේ සඳහන් කර ඇති ගෙවීම් විධිවිධානයන්හි කුමක් සඳහන්ව තිබුනද, කාඩ්පත් භාවිතා කලද එහෙත් තවමත් කාඩ්පත්හිමියාගේ ගිණුම වෙත හර වී නොමැති මුදල් ප්‍රමාණයද සමග කාඩ්පත් ගිණුමක හිඟව පවතින මුළු මුදල (සියලුම පරිපූරක කාඩ්පත්ද ඇතුළුව), මුළු හිඟ මුදල බවට පත්වන අතර එම මුදල, ගිවිසුම අවලංගු කිරීමේදී වහාම පියවිය යුතුය. මෙම ගිවිසුම අවලංගු කිරීම, දෙකට කපා වෙන් කරන ලද කාඩ්පත (කාඩ්පත්)ද සමග කාඩ්පත්හිමියා විසින් බැංකුව වෙත ලබා දෙනු ලබන ලිඛිත දැනුම්දීමක් මගින් හෝ බැංකුව විසින් හෝ කාඩ්පත්හිමියාගේ මරණය, බංකොලොත්භාවය හෝ වස්තුභන්ගත්වය හේතුවෙන් හෝ බැංකුව වෙත ආරෝපණීය කල නොහැකි ඕනෑම හේතුවක් නිසාවෙන් කාඩ්පත්හිමියා පිලිබඳ කිසිදු තොරතුරක් බැංකුවහට සොයා ගැනීමට නොහැකි වූ අවස්ථාවකදී මෙම ගිවිසුම අවලංගු වනු ඇත. කාඩ්පත් ගිණුමෙහි පවතින ඕනෑම හිඟ මුදලක් සම්පූර්ණයෙන්ම පියවීමේ වගකීම කාඩ්පත්හිමියා සහ / හෝ ඔහුගේ බලය ලද්දන් සතු වන අතර එවැනි හිඟ මුදලක් නැවත පියවා ගැනීමේදී බැංකුවහට දැරීමට සිදුවන සියලු පිරිවැය (නීතිමය ගාස්තු හා අයකිරීම්ද ඇතුලත්ව) සහ වියදම් සඳහා වන්දිගෙවිය යුතුය. එවැනි නැවත ගෙවිය යුතු මුදල් නොගෙවා පවතීනම්, දැනට පවතින අනුපාතයන්ට අනුව නොකඩවා පොළී සහ වෙනත් අයකිරීම් සිදු කරගෙන යාමට බැංකුව හිමිකම් ලබයි.

19.2 ප්‍රාථමික කාඩ්පත්හිමියා විසින් මෙම කාඩ්පත් අවලංගු කරනු ලැබූ අවස්ථාවකදී, සියලුම හිඟ මුදල් ගෙවා අවසන් වන තුරු සහ සියලුම කාඩ්පත් දෙකට කපා වෙන්කර නැවත බැංකුව වෙත භාර දෙන තුරු, මෙහි සඳහන් කොන්දේසි හා නියමයන්ට අනුව සියලුම ගාස්තු හා වෙනත්

වගකීම් සඳහා ප්‍රාථමික කාඩ්පත්හිමියා සහ පරිපූරක කාඩ්පත්හිමියා (කාඩ්පත්හිමියන්) සාමූහිකව සහ තනි තනිව බැංකුව වෙත වගකිව යුතුය.

19.3 පෙර දැනුම් දීමක් සිදු කර හෝ සිදු නොකර සහ හේතුවක් සහිතව හෝ රහිතව කාඩ්පත අවලංගු කර හෝ කාඩ්පත අලුත්කිරීම ප්‍රතික්ෂේප කර බැංකුව විසින් ඕනෑම අවස්ථාවකදී මෙම ගිවිසුම අවසන් කරනු ඇත. එවැනි අවසන් කිරීමක් සිදු නොවුනේනම් හෝ අවසන් කිරීමක් සිදු වන තෙක්, කලින් කලට බැංකුව විසින් කාඩ්පත්හිමියා (කාඩ්පත්හිමියන්) වෙත නව කාඩ්පතක් (අලුත් කරන ලද කාඩ්පත) ලබා දෙනු ඇත.

19.4 කාඩ්පත් ගිණුම අවසන් කරනු ලබන අවස්ථාවකදී වාර්ෂික සාමාජික ගාස්තුව හෝ ඉන් කොටසක් හෝ නැවත ගෙවීමට බැංකුව බැඳී නොසිටී.

19.5 කාඩ්පත කාඩ්පත්හිමියා විසින් හෝ බැංකුව විසින් හෝ ගිවිසුම අවසන් කිරීම මගින් හෝ අවලංගු කලද, කාඩ්පත නිකුත් කිරීම සඳහා ඇපකරයක් ලෙස බැංකුව විසින් ඕනෑම සුරැකුමක් රඳවා ගෙන ඇති අවස්ථාවකදී, සියලු හිඟ මුදල් පියවීමෙන් අනතුරුවද කාඩ්පත අවලංගු කර කාඩ්පත නැවත බැංකුව වෙත භාර දුන් දිනයෙන් පසුව අවම වශයෙන් දින 45ක කාලසීමාවක් සඳහා එම සුරැකුම තව දුරටත් රඳවා තබා ගැනීමට බැංකුවට අයිතිය පවතී.

19.6 කුමන පාර්ශවයක් විසින් මෙම ගිවිසුම අවලංගු කලද, කාඩ්පත භාවිතය නිසා ඉදිරියට අය කරනු ලබන ගාස්තු සඳහා කාඩ්පත්හිමියා තවදුරටත් වගකිව යුතු වේ.

20. **වගකීම් වලින් බැහැරවීම**

පහත කරුණු නිසාවෙන් සෘජුව හෝ වක්‍රව සිදු වන පාඩුවක් හෝ හානියක් සඳහා කුමන ආකාරයකට හෝ කාඩ්පත්හිමියා වෙත බැංකුව විසින් කිසිදු වගකීමක් දරනු නොලැබේ.

20.1 බැංකුව හෝ වෙළඳ ආයතනයක් හෝ වෙනත් බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් හෝ ඕනෑම ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍රයක් හෝ වෙනත් පාර්ශවයක් කාඩ්පත් ගනුදෙනුවක් ප්‍රතික්ෂේප කිරීම හෝ දීර්ඝ කිරීම හෝ ණය සීමාව දක්වා හෝ ඉන් ඔබ්බට මුදල් අත්තිකාරම් ලබා දීම ප්‍රතික්ෂේප කිරීම හෝ හේතුකොටගෙන කාඩ්පත්හිමියාහට සිදුවූ හෝ විඳීමට සිදු වූ ඕනෑම පාඩුවක් හෝ හානියක්;

20.2 ඕනෑම වෙළඳ ආයතනයක් හෝ ඕනෑම ගෙවීම් සංවිධානයක සාමාජික ආයතනයක් කාඩ්පත භාරගැනීම හෝ ඕනෑම වෙළඳ ආයතනයක් විසින් කාඩ්පත්හිමියා වෙත ලබා දුන් භාණ්ඩ හා සේවාවන්හි ඕනෑම දෝෂයක් හෝ අඩුපාඩුවක් සඳහා කාඩ්පත පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීමක්, හෝ කාඩ්පත් ගනුදෙනු සම්බන්ධ ඕනෑම උල්ලංඝනය කිරීමක් හෝ ක්‍රියා නොකිරීමක් අදාළ වන අවස්ථාවකදී;

20.3 ඕනෑම ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍රයක් / POS ටර්මිනලයක් ක්‍රමවත්ව ක්‍රියා නොකිරීම හෝ සන්නිවේදන පද්ධත්යෙහි ඇතිවන බාධා හා බිඳ වැටීම්;

20.4 කාඩ්පතෙහි මුද්‍රණය කර ඇති අවලංගු වීමේ දිනයට පෙර භාර දීමට ඉල්ලීම හෝ භාර දීම සිදු කිරීම සහ / අත් කර ගැනීම බැංකුව විසින් හෝ වෙනත් ඕනෑම පුද්ගලයෙකු විසින් හෝ ATM යන්ත්‍රය/POS ටර්මිලය මගින් සිදු වුවද, කාඩ්පත නැවත භාර දීමට ඉල්ලීම හෝ අත්කර ගැනීමට ඇති අයිතිය පිළිබඳව සිදු කරනු ලබන ක්‍රියාවක් ;

20.5 19 වන වගන්තියට (අවලංගු කිරීම) අනුව ඕනෑම කාඩ්පතක් හෝ කාඩ්පත් ගිණුමක් අවලංගු කිරීමට ඇති අයිතිය පිළිබඳ බැංකුව විසින් සිදු කරනු ලබන ක්‍රියාවක් ;

20.6 කාඩ්පත නැවත ලබා ගැනීම හා ඒ පිළිබඳ කාඩ්පත්හිමියාගේ ණය ස්වභාවයට හෝ කීර්තිනාමයට සිදු වන ඕනෑම හානියක්, ඕනෑම පුද්ගලයෙකු විසින් කාඩ්පතට ගරු කිරීම හෝ පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ කරනු ලබන ඕනෑම ඉල්ලීමක්;

20.7 22වන වගන්තියට (බැංකුවෙහි පොත්, වාර්තා සහ පාරිභෝගික තොරතුරු) අනුව බැංකුව විසින් අනාවරණය කර ඇති ඕනෑම තොරතුරක් සම්බන්ධයෙන් යම්කිසි වැරදි ප්‍රකාශයක්, වැරදි නියෝජනයක්, දෝෂයක් හෝ අතපසුවීමක් ;

20.8 කාඩ්පත්හිමියා සහ ඕනෑම වෙළඳ ආයතනයක් හෝ බැංකුව හෝ මූල්‍ය ආයතනයක් හෝ වෙනත් ඕනෑම පුද්ගලයෙකු අතර ඇතිවන ඕනෑම මතභේදයක්, වෙළඳ ආයතනයක් හෝ බැංකුව හෝ මූල්‍ය ආයතනයක් හෝ වෙනත් ඕනෑම පුද්ගලයෙකුට එරෙහිව කාඩ්පත්හිමියා හට තිබිය හැකි එවැනි මතභේදයක් හෝ ප්‍රතික්ෂේප කිරීමක් හෝ හිලවු කිරීමේ අයිතියක් හේතු කොටගෙන කාඩ්පත්හිමියා විසින් බැංකුව වෙත ඇති වගකීම කිසිදු ආකාරයකින් බලපෑමට ලක් නොවේ.

20.9 දේව ක්‍රියාවන්, කැරලි, සිවිල් කැළඹීම්, කෝලාහල, යුධ තත්වයන් හෝ පාලනයෙන් තොර වෙනත් ඕනෑම සිදුවීමක් හෝ වැඩවර්ජන හෝ වසා දැමීම් හේතුකොට ගෙන ව්‍යාපාරයට බාධාවීම් නිසාවෙන් ඇතිවන ප්‍රතිවිපාකයන්;

21. **සංස්ථාපිත කාඩ්පත් පිළිබඳ වගකීම**

සේවක මණ්ඩලය, විධායකයින්, අධ්‍යක්ෂකවරුන් හෝ සංස්ථාපිත ආයතනය මගින් බලය ලබා දෙනු ලැබූ වෙනත් ඕනෑම පුද්ගලයෙකු නමින් සුදුසුකම් ලත් සංස්ථාපිත ආයතන වෙත නිකුත් කරනු ලබන සියලුම කාඩ්පත්, කාඩ්පත්හිමියා මෙන්ම සංස්ථාපිත ආයතනයෙහි එක්ව හා තනි තනි වශයෙන් වන වගකීම යටතේ ක්‍රියාත්මක වේ.

22. **බැංකුවෙහි පොත්, වාර්තා සහ පාරිභෝගික තොරතුරු**

22.1 බැංකුවෙහි පොත්, වාර්තා සහ පාරිභෝගික තොරතුරු තීරණාත්මක සහ අනුගම්‍ය විය යුතුය. බැංකුව විසින් නිකුත් කරනු ලබන ඕනෑම සහතිකයක්, මුද්‍රණ පිටපතක් හෝ ගිණුම් ප්‍රකාශනයක් ඕනෑම නීතිමය කටයුත්තකදී හෝ වෙනත් අවස්ථාවකදී කාඩ්පත්හිමියාට එරෙහිව ඒවායෙහි නිරවද්‍යතාවය පිළිබඳ අවසන් හා තීරණාත්මක සාක්ෂියක් වනු ඇත.

22.2 බැංකුව වෙත හෝ බැංකුව මගින් ලබා ගනු ලබන දුරකථන ඇමතුම්, පාරිභෝගිකයාගේ සහ බැංකුවෙහි අයිතීන් ආරක්ෂා කිරීම සඳහා පටිගත විය හැකි බව කාඩ්පත්හිමියා විසින් පිළිගෙන භාරගනු ලැබේ.

22.3 බැංකුව විසින් සිය දත්ත, තොරතුරු සහ වාර්තා විද්‍යුත් සංයුතියෙන් හෝ අනු සේයාපට හෝ වෙනත් ක්‍රමවේදයකින් (සැකසුම් මධ්‍යස්ථානයන්හි සහ ශ්‍රී ලංකාවෙන් පිටත දත්ත සමුදායන්හිද ඇතුළුව) පවත්වාගෙන යාම, සැකසීම හා ගබඩා කිරීම සිදු කල හැකි බවට කාඩ්පත්හිමියා විසින් මෙයින් පිළිගෙන එකඟ වන අතර ලිපිගොනු, පොත්, වාර්තා හෝ ගිණුම් වලින් උපුටා ගැනීමක් ලෙස බැංකුව විසින් ප්‍රදර්ශනය කල හැකි පණිවිඩ, කේබල්, ෆැක්ස්, අනු සේයා පට, තැටි, ඡායා පිටපත්, පරිගණක මුද්‍රණ පිටපත් වල අන්තර්ගතයේ අව්‍යාජභාවය පිළිබඳ නිශ්චිත සාක්ෂි අඩංගු වන බවට තවදුරටත් එකඟ වේ.

22.4 බැංකුව විසින් තුන්වන පාර්ශවයේ කොන්ත්‍රාත්කරුවන්ගේ සේවාවන් භාවිතා කරනු ඇති බවටත් එවැනි තුන්වන පාර්ශවයන්හට කාඩ්පත්හිමියා සහ කාඩ්පත් ගිණුම සම්බන්ධ තොරතුරුද ඇතුලත්ව බැංකුවෙහි පොත් සහ වාර්තා වෙත ඇතුලු වීමේ හැකියාව පවතින බවටත් කාඩ්පත්හිමියා විසින් පිළිගෙන එකඟවේ.

22.5 පාරිභෝගිකයාහට බැංකුව සමග ඇති සබඳතාවය (හිඟ මුදල, ගිණුමෙහි ඉතිහාසය සහ වෙනත් කාඩ්පත්හිමියාට අදාළ තොරතුරුද ඇතුලත්ව) බැංකුව විසින් වෙනත් ඕනෑම බැංකු ශාඛාවක් වෙත හෝ බැංකුවෙහි කාර්යාලය වෙත හෝ බැංකුවෙහි අනුබද්ධිත ආයතනයක් වෙත හෝ බැංකුවෙහි ඕනෑම සාමාජිකයෙකු වෙත හෝ ශ්‍රී ලංකාවේ හෝ වෙනත් රටක යම් උසාවි නියෝගයක් අනුගමනය කිරීම සඳහා ඕනෑම නියාමන අධිකාරියකට, බැංකුවෙහි ඕනෑම පැවරුම්ලාභියෙකු විය හැකි අයෙකු වෙත; ඕනෑම ඇපකරුවෙකු වෙත; තුන්වන පාර්ශවයක් හෝ ආරක්ෂිත සේවා සැපයුම්කරුවෙකු වෙත; නිර්දේශයක් සඳහා තෙවන පාර්ශවයක් විසින් සිදු කරනු ලබන ඕනෑම ඉල්ලීමක් වෙත ප්‍රතිචාර දැක්වීම සඳහා; සහ බැංකුවෙහි වෘත්තීය උපදේශකයින්,

නියෝජිතයන්, සහ ස්වාධීන කොන්ත්‍රාත්කරුවන් වෙත හෙළිදරව් කිරීමට හා වාර්තා කිරීමට කැමැත්ත ප්‍රකාශ කරයි. එවැනි හෙළිදරව් කිරීමකට හෝ වාර්තා කිරීමක් හේතුකොටගෙන විදීමට සිදු වූ හෝ චෝදනා ලැබූ ඕනෑම පාඩුවක්, හානියක් හෝ හිංසනයක් සඳහා බැංකුවට එරෙහිව කාඩ්පත්හිමියා විසින් කිසිදු හිමිකමක් ප්‍රකාශ නොකළ යුතු අතර එවන් හිමිකමක් ප්‍රකාශ කිරීමට අයිතියක්ද නොමැති වනු ඇත. කාඩ්පත්හිමියා(කාඩ්පත්හිමියන්) හට තවදුරටත් බැංකුව විසින් ලබා දෙනු ලබන කාඩ්පතක් නොමැති අවස්ථාවේදීද මෙම සම්මුතිය ක්‍රියාත්මක වේ.

22.6 බැංකුවට සුදුසු යයි හැඟෙන ඕනෑම අවස්ථාවකදී ඔවුන්හට නිර්දේශයකින් තොරව කාඩ්පතක් අයදුම්කරන්නෙකුගේ ණය තත්වය පරීක්ෂා කිරීමේ සහ / හෝ කාඩ්පත්හිමියකුගේ ණය තත්වය පරීක්ෂා කිරීමේ අයිතිය බැංකුව සතු වනු ඇත.

22.7 බැංකුව සහ / හෝ එහි ඕනෑම නිලධාරීන් / සේවකයින් හට පාරිභෝගිකයාගේ/ පාරිභෝගිකයන්ගේ ව්‍යාපාර පිලිබඳ තොරතුරු, බැංකුව සමග හෝ වෙනත් සමූහ සාමාජිකයින් සමග පවතින ගිණුම් හෝ බැංකුව හෝ වෙනත් සමූහ සාමාජිකයින් සහ පාරිභෝගිකයා/පාරිභෝගිකයින් අතර ඇති සබඳතාව යනාදියද ඇතුලත්ව (එහෙත් ඊට සීමා නොවී) කාඩ්පත් ගිණුම පිලිබඳ ඕනෑම තොරතුරක් ඕනෑම කාර්යයක් සඳහා පහත දක්වා ඇති පාර්ශවයන් හට හෙළිදරව් කිරීම අයිතිය හිමිවේ.

22.7.1 බැංකුවෙහි ඕනෑම ශාඛාවක් හෝ සමූහයෙහි වෙනත් සාමාජිකයෙකු

22.7.2 ඕනෑම නියාමන, අධීක්ෂණ, බැංකුව කෙරෙහි හෝ එහි සමූහයෙහි වෙනත් සාමාජිකයෙකු කෙරෙහි බලය ඇති රජයේ අධිකාරියක්

22.7.3 නීතියෙන් හෝ උසාවි නියෝගයක් මගින් බැංකුව විසින් එබඳු හෙළිදරව් කිරීමක් සිදු කල යුතු බවට හෝ බලය ලබා දෙනු ලබන බවට සඳහන් කරනු ලබන ඕනෑම පුද්ගලයෙකු.

22.7.4 බැංකුවෙහි රහස්‍යභාවය පිලිබඳ රාජකාරියෙහි නියුතු ඕනෑම පුද්ගලයෙකුහට.

23. දුරකථන, ටෙලි මුද්‍රණ, කේබල්, ෆැක්ස් සහ විද්‍යුත් තැපැල් උපදෙස් සඳහා බලය ලබා දීම හා වන්දි පූරණය

23.1 උපදේශය ලබා දෙන හෝ ප්‍රකාශයට පත් කරන පුද්ගලයාගේ බලය හෝ අනන්‍යතාවය ඇතුලු කරුණු වල පොදු ස්වභාවය පිලිබඳ පූර්ව මතයක් නොමැතිව සහ උපදෙස් පිළිගැනීමේ කාලය තුල පවතින තත්වයන් නොතකා බැංකුව මගින් ඉටුවිය යුතු කොටස පිලිබඳ විමසුමකින් තොරව, කාඩ්පත්හිමියා (කාඩ්පත්හිමියන්) විසින් ඔහු වෙනුවෙන් දුරකථන, කේබල්, ෆැක්ස් හෝ විද්‍යුත් තැපැල මගින් කලින් කලට ලබා දෙනු ලබන ඕනෑම දැනුම්දීමක්, උපදෙසක්, ඉල්ලීමක් හෝ වෙනත් සන්නිවේදනයක් (උපදෙස්) මත විශ්වාසය තබා ගැනීමට හෝ ඒ අනුව ක්‍රියා කිරීමට

කාඩ්පත්හිමියා විසින් බැංකුව වෙත බලය ලබා දෙනු ලැබේ. උපදෙස් ලැබෙනු ලබන වේලාව සහ දිනය පිලිබඳ බැංකුවෙහි තීරණය කාඩ්පත්හිමියා විසින් පිළිගත යුතු අතර විද්‍යුත් තැපැල මගින් ලබාද එනු ලබන උපදෙස් සඳහා පමණක්, එම පණිවිඩය එවනු ලැබූ දිනය සැලකිල්ලට ගනු ඇත.

23.2 ගනුදෙනුවෙහි ස්වභාවය හෝ සැලැස්ම හෝ මුදල් ප්‍රමාණය නොසලකා, යම් දෝෂයක්, අර්ථ ව්‍යාකුල බවක්, වැරදි වැටහීමක් හෝ උපදෙස්වල අපැහැදිලි බවක් තිබුනද, එසේ ලබා දෙනු ලබන උපදෙස් කාඩ්පත්හිමියාගේ පූර්ණ බලයලත් හා කාඩ්පත්හිමියාගේ බැඳීමට යටත්ව ලබා දුන් ලෙස සැලකීමට බැංකුව වෙත හිමිකම් ලැබෙන අතර උපදෙස් මගින් මුදල් ගෙවීමට හෝ ඕනෑම ගිණුමක් හර කිරීමට හෝ බැර කිරීමට හෝ ඕනෑම මුදලක් හෝ ලේඛනයක් පවරා දීමට හෝ බැංකුව සමග හෝ වෙනත් ඕනෑම පුද්ගලයෙකු සමග ඕනෑම ගිවිසුමක් හෝ වෙනත් සැලැස්මක් සඳහා කාඩ්පත්හිමියා බඳවා ගැනීමේ අභිප්‍රායන්ට සම්බන්ධව හෝ කුමන ආකාරයේ හෝ වෙනත් වර්ගයක ගනුදෙනුවක් හෝ සැලැස්මක් සඳහා කාඩ්පත්හිමියා බැඳී සිටීම සඳහා හෝ උපදෙස් ලබා දී තිබුනද, බැංකුව විසින් සුදුසු යයි සලකා බලා එම උපදෙස් මත රඳා පවතින හෝ ඊට අදාලව එවැනි පියවර ගැනීමට බැංකුව හිමිකම් ලබයි.

23.3 මෙම බලය පැවරීමේ හා වන්දි පූරණයේ කොන්දේසි වලට අනුව බැංකුව ක්‍රියා කිරීම සැලකිල්ලට ගැනීමේදී කාඩ්පත්හිමියා විසින් බැංකුව වන්දි පූරණය කිරීමට හා ස්වභාවයෙන් හෝ උපදෙස් වලට පිටතින් හෝ උපදෙස් වලට අනුව කුමන ආකාරයකින් ඇතිවන හෝ ඒවා උල්ලංඝනය කිරීමකින් හෝ මෙහි දක්වා ඇති බැංකුව සතු අයිතිවාසිකම් බලාත්මක කිරීමෙන් සිදුවන සියලුම පාඩු, හිමිකම්, ක්‍රියාවන්, ක්‍රියාපටිපාටීන්, ඉල්ලීම්, හානි, පිරිවැය, වගකීම් හා නීතිමය හෝ එසේ නොවන බැංකුව වෙත ඇතිවන හෝ පවතින වියදම් වලට එරෙහිව බැංකුව වෙත වන්දි ගෙවීමට අනිවාර්යයෙන් බැඳී සිටී. ඒ හා සම්බන්ධ සියලුම පිරිවැය හා වියදම් කාඩ්පත් ගිණුම වෙත බැර වනු ඇති අතර කාඩ්පත්හිමියා විසින් ගෙවිය යුතු වේ.

23.4 කාඩ්පත්හිමියා විසින් කාඩ්පත අවලංගු කිරීම සඳහා ලබා දෙනු ලබන දැනුම් දීම පිලිබඳ ක්‍රියා කිරීමට බැංකුව හට ප්‍රමාණවත් කාලයක් ලැබුනහොත් හෝ ලැබෙන තුරු මෙම බලය පැවරීමේ හා වන්දි පූරණයේ කොන්දේසි පූර්ණ බලය හා බලපෑම සහිතව පවතිනු ඇති අතර එවැනි දැනුම්දීමක් මගින් එම දැනුම්දීම ලබා දීමට පෙර බලය පැවරීම හා වන්දි පූරණය හා සම්බන්ධ කොන්දේසි වලට අනුව සිදු කරනු ලැබූ ඕනෑම ක්‍රියාවක් සම්බන්ධයෙන් බලය පැවරීම හා වන්දි පූරණය යටතේ වන ඕනෑම වගකීමකින් කාඩ්පත්හිමියා නිදහස් කිරීමක් සිදු නොවනු ඇත.

23.5 දුරකථන, කේබල්, ෆැක්ස් හෝ විද්‍යුත් තැපැල යන මාර්ගයන් භාවිතයෙන් උපදෙස් ලබා දීමේදී එම මාර්ගයන් බැංකුව වෙත උපදෙස් ලබා දීම සඳහා වන ආරක්ෂිත මාර්ගයන් නොවන බව කාඩ්පත්හිමියා විසින් පිළිගෙන භාර ගනු ලබන අතර මින් මතුවට ඒ හා සම්බන්ධව ඇති අවදානම පිලිබඳ දැනුවත්ව හා අදාළ අවදානම කාඩ්පත්හිමියා විසින් තනිව භාරගනිමින්, කාඩ්පත්හිමියාගේ පහසුව සඳහා අවස්ථාව ලබා දී ඇති එම වැඩපිළිවෙලට අනුව ක්‍රියා කරනු ඇත.

24. **පියවීමට ඇති අයිතිය හා සුරකුම් ලෙස තබා ඇති මුදල්**

24.1 පියවීම හා සම්බන්ධව ඇති පොදු අයිතීන් හා නීතිය මගින් ලබා දී ඇති හෝ වෙනත් ඕනෑම ගිවිසුමක් යටතේ ලබා දී ඇති අයිතීන්ට අමතරව, කාඩ්පත්හිමියාගේ බැංකුව සමග ඇති ඕනෑම ශ්‍රී ලංකා රුපියල හෝ විදේශ මුදල් ඒකකයකින් ඕනෑම සටහනක් යටතේ කවර හෝ ස්ථානයක පවතින, අවශ්‍ය පරිදි ශේෂය නොපවතින ඕනෑම ගිණුමක් (ගිණුම්) යටතේ ඇති සියලුම හිඟ මුදල් පියවීම සඳහා හෝ ඒ වෙනුවෙන් බැංකුව සිය තනි අභිමතය පරිදි ඕනෑම වේලාවකදී කිසිඳු දැනුම්දීමකින් තොරව බැංකුව සමග පවතින කාඩ්පත්හිමියාගේ සියලුම හෝ ඕනෑම ශ්‍රී ලංකා රුපියල හෝ විදේශ මුදල් ඒකකයකින් ඕනෑම සටහනක් යටතේ කවර හෝ ස්ථානයක පවතින පවතින තනි හෝ හවුල් ගිණුමක් (ගිණුම්) ඒකාබද්ධ කිරීම හෝ සංයුක්ත කිරීම හෝ පරිපූරක කාඩ්පත්හිමියා (කාඩ්පත්හිමියන්) සමග පවතින හවුල් ගිණුමද ඇතුලත්ව එවැනි ගිණුමක (ගිණුම් වල) බැරව පවතින ඕනෑම මුදලක් පියවීම හෝ මුදල් මාරු කිරීම සිදු කල හැකි බවට කාඩ්පත්හිමියා එකඟ වේ. බැංකුවෙහි තනි අභිමතය පරිදි තීරණය කරනු ලබන දැනට පවතින විනිමය අනුපාතිකයන්ට අනුව අවශ්‍ය පරිවර්තනයන්ද සමගින් එවැනි ඕනෑම හිලව් කිරීමක් සඳහා සිදු කරනු ලබන ඕනෑම සංයෝජනයක්, ඒකාබද්ධ කිරීමක්, පියවීමක් හෝ මාරු කිරීමක් සඳහා කාඩ්පත්හිමියා විසින් බැංකුව වෙත බලය ලබාදේ.

24.2 කාඩ්පත්හිමියාහට වරක් ආඥාවක් හෝ කැඳවුම් නියෝගයක් නිකුත් කර තිබීම හෝ කාඩ්පත්හිමියාගේ බංකොලොත්භාවය හෝ බුන්වත්භාවය ඔප්පුකිරීම සඳහා හෝ බැංකුව විසින් සුදුසු යයි සිතනු ලබන වෙනත් එවැනි හේතු සඳහා යනාදියද ඇතුලත්ව ඕනෑම පාර්ශවයක වගකීම රඳවා තබා ගැනීමට බැංකුව සමත් වීමේ අරමුණ සඳහා, බැංකුව විසින් ඕනෑම අවස්ථාවකදී බැංකුව සතුව ඇති එම මුදල් සම්පූර්ණ වශයෙන් හෝ කොටසක් නිදහස් කිරීමට ඉල්ලුම් කිරීම වෙනුවෙන් බැංකුව වෙත කිසිඳු අතරමැදි බැඳීමකින් තොරව බැංකුවට සුදුසු යයි සිතන ආකාරයට කාඩ්පත්හිමියා වෙත මෙහි දක්වා ඇති පරිදි හෝ කාඩ්පත්හිමියාගේ ණය වෙනුවෙන් වෙනත් සුරකුමක් හෝ ඇපයක් යටතේ ලැබුණු, අයකරවා ගත්, බැර වූ මුදල් යම් කාල සීමාවක් සඳහා රඳවාගෙන තබා ගනු ඇත.

24.3 ක්‍රෙඩිට් කාඩ්පතක් ලබා දීමේදී සුරකුමක් ලෙස අපගේ ඕනෑම ශාඛාවක ඇති තැන්පතු ගිණුමක මුදල් තැන්පත් කර තබන ලෙසට බැංකුව විසින් කාඩ්පත්හිමියාහට දැනුම්දෙනු ඇත. මෙම සුරකුම් මගින් බැංකුව වෙත ඇති යම් හිඟ මුදලක් පියවා ගැනීමේ අයිතිය බැංකුව සතු වේ. ඕනෑම අවස්ථාවකදී කාඩ්පත්හිමියා විසින් මෙම තැන්පතු මුදල භාවිතා කරන්නේ නම්, ඒ පිලිබඳ බැංකුව වෙත පෙර දැනුම් දීමක් සිදු කල යුතු අතර කාඩ්පත්හිමියාගේ ක්‍රෙඩිට් කාඩ්පතෙහි හැසිරීම සැලකිල්ලට ගනිමින් බැංකුව විසින් සිය තනි අභිමතය පරිදි ඒ පිලිබඳ තීරණය කරනු ඇත. සුරකුම් ලෙස පවත්වාගෙන යනු ලබන එවැනි මුදල් නිදහස් කිරීම සඳහා අදාළ තීරණය ගැනීමෙන් අනතුරුව දින තුනක (3) කාලසීමාවක් ලබා ගනු ඇත.

25. **නීතිමය පියවර**

ඕනෑම හේතුවක් මත මෙම ගිවිසුමෙහි සඳහන් කොන්දේසි හා නියමයන් සඳහා අනුකූල වීමට කාඩ්පත්හිමියාහට නොහැකි වුවහොත් බැංකුව විසින් මෙම කාඩ්පත්හිමියන් සඳහා වූ ගිවිසුම අවලංගු කරනු ලබන අතර ඒ යටතේ හිඟව පවතින සියලුම මුදල් ආපසු අයකරවා ගැනීමට කටයුතු කරනු ඇත. බැංකුව විසින් දරනු ලැබූ නීතිමය ගාස්තුද ඇතුලත්ව සියලුම පිරිවැය, ගාස්තු සහ වියදම් සඳහා පූර්ණ වන්දිපූරණ පදනම යටතේ කාඩ්පත්හිමියා විසින් වගකිව යුතුය.

26. නිවේදන

26.1 කාඩ්පත්හිමියා විසින් තම නම, රැකියාව, ව්‍යාපාරය හෝ ලිපිනය (කාර්යාලීය හෝ පදිංචි ලිපින) හා අදාළ දුරකථන අංකයන්හි යම් වෙනසක් සිදුවූයේ නම්, ඒ පිලිබඳ බැංකුවෙහි කාඩ්පත් මධ්‍යස්ථානය වෙත ලිඛිත දැනුම්දීමක් ලෙස ක්ෂණිකව දැනුම්දිය යුතුය.

26.2 සියලුම කාඩ්පත්, ගිණුම් වල PIN අංක ප්‍රකාශන, ඉල්ලීම් හෝ මෙම කොන්දේසි හා නියමයන් යටතේ වන වෙනත් ඕනෑම සන්නිවේදනයක්, අවසාන වශයෙන් බිල්පත් සඳහා ලබා දී ඇති ලිපිනය හෝ කාඩ්පත්හිමියාගේ වෙනත් ලිපිනයක් හරහා පෞද්ගලිකව ඔබ වෙත හෝ කුරියර් මාර්ගයෙන් හෝ සාමාන්‍ය තැපැල මගින් ලබා දෙනු ඇති අතර එවැනි සන්නිවේදනයක්, පෞද්ගලිකව කාඩ්පත්හිමියාගේ අතට ලබා දෙන්නේ නම්, එසේ ලබා දුන් දිනයේම සහ කුරියර් හෝ සාමාන්‍ය තැපැල මගින් ලබා දෙන්නේ නම්, සන්නිවේදනය එවීමෙන් පසු වැඩ කරන දින තුනක් (3) ඇතුලත කාඩ්පත්හිමියා වෙත ලැබුණු බවට සලකනු ලැබේ.

26.3 මෙම කොන්දේසි හා නියමයන් යටතේ ඇති ප්‍රාථමික කාඩ්පත්හිමියා සහ / හෝ පරිපූරක කාඩ්පත්හිමියා වෙත යවනු ලැබූ සියලුම සන්නිවේදනයන්, ඔවුන් දෙදෙනා වෙතම යවනු ලැබූ සන්නිවේදනයන් ලෙස සලකනු ලැබේ.

26.4 කාඩ්පත්හිමියා විසින් බැංකුවෙහි අලෙවි තොරතුරු හෝ එහි නිෂ්පාදන හා සේවාවන් පිලිබඳ විස්තර, විද්‍යුත් තැපැල, කෙටි පණිවිඩ, ෆැක්ස්, තැපැල, දුරකථන මාර්ග ආදිය හරහා තමා වෙත එවීම සඳහා බැංකුව වෙත බලය ලබා දේ.

27. පොදු

27.1 කාඩ්පත්හිමියාගේ උපදෙස් මත සද්භාවයෙන් ක්‍රියා කිරීම පිලිබඳ බැංකුව විසින් වගකියනු නොලැබේ.

27.2 එවැනි ඕනෑම උපදෙසක් පටිගත කිරීමට සහ එම වාර්තා අධිකරණයක් තුල සාක්ෂි ලෙස භාවිතා කිරීමට හා නීතිමය කරයුතු වලදී භාවිතා කිරීමටත් කාඩ්පත්හිමියා විසින් සිය අභිමතය පරිදි බැංකුව වෙත බලය ලබා දේ.

27.3 මෙම ගිවිසුම යටතේ කාඩ්පත්හිමියාගෙන් බැංකුව වෙත හිඟව ඇති සියලුම මුදල් එකතු කිරීම සඳහා නියෝජිතයෙකු පත් කිරීමට බැංකුවට හිමිකම් පවතී

27.4 කාඩ්පත්හිමියාගේ අවසරයකින් තොරව ඕනෑම අවස්ථාවකදී කාඩ්පත්හිමියාහට දන්වා හෝ කිසිදු දැනුම්දීමකින් තොරව මෙම ගිවිසුම යටතේ ඇති අයිතිවාසිකම් හෝ වගකීම් සියල්ල හෝ ඉන් කොටසක් පැවරීමට බැංකුවට හිමිකම් පවතී.

27.5 බැංකුව විසින් කලින් කලට තවදුරටත් ඉල්ලුම් කරනු ලබන ලියකියවිලි අත්සන් කිරීමට කාඩ්පත්හිමියා විසින් කටයුතු කල යුතුය.

27.6 මෙහි ලබා දී ඇති අයිතිවාසිකම් හා පිළියම්, නීතිය මගින් ලබා දී ඇති කිසිඳු අකාරයේ අයිතිවාසිකම් හා පිළියම් සමග සමුච්චිත වන අතර පරම නොවේ.

27.7 මෙහි දක්වා ඇති කොන්දේසි හා නියමයන් කාඩ්පත්හිමියා සමග බැඳී පවතින අතර ඔහු විසින් මෙහි සඳහන් ඔහුගේ වගකීම් වෙනත් කිසිවෙකුහට නොපැවරිය යුතුය.

27.8 මෙම කොන්දේසි හා නියමයන්ගෙන් ඕනෑම එකක් හෝ කාඩ්පත්හිමියාගේ ණය පැහැර හැරීමක් හෝ උල්ලංඝනය කිරීමක්, බැංකුව විසින් ඕනෑම අවස්ථාවකදී කොන්දේසි විරහිතව හෝ සහිතව ඉවත්කර දැමීමට හැකියාව ඇත. එසේ ඇත්තේ ඉවත් කිරීම පිලිබඳ බැංකුව මගින් ලිඛිතවලබා දී ඇත්නම් හා ඉහත සඳහන් පරිදි මෙම කොන්දේසි හා නියමයන්හි බැංකුවෙහි කොටස පිලිබඳ පහරහරීමක් හෝ උල්ලංඝනය කිරීමක් මත තත්වාරෝපණයක් හෝ එක්කසනය කිරීමක් සිදු වී නොමැති නම් පමණි. බැංකුව විසින් සිදු කරන ලද හෝ සිදු නොකරන ලද ඕනෑම දෙයක් පිලිබඳ බැංකුව සතු අයිතිය හෝ බලය ඉවත් වීමක් ව්‍යංගාර්ථයෙන් හෝ සෘජුව ගම්‍ය වේ නම් එවැනි ඉවත් කිරීමක් සිදු නොවන අතර බැංකුව විසින් ලිඛිතව ලබා දී ඇත්නම් පමණක් එවැනි ඉවත්කිරීමක් සිදු වේ. එවැනි අත්හිටුවීමක්, එම අවස්ථාවට අදාළව සම්බන්ධ වූ කරුණ මත පමණක් ක්‍රියාත්මක වන අතර, එය අනෙක් නියමයන් හා කොන්දේසි වලින් ඉවත් කිරීමක් හෝ නිදහස් කිරීමක් ලෙස ක්‍රියා නොකළ යුතුය.

27.9 අදාළ වෙළඳ ස්ථානයන් මගින් ලබා දෙනු ලබන විශේෂ වට්ටම් / දීමනා හා සම්බන්ධව බැංකුව විසින් කිසිඳු වගකීමක් නොදරනු ඇති අතර මෙම දීමනාවන් හා සම්බන්ධව ලබා දී ඇති බෙදා හැරීම්, ගුණාත්මකභාවය, නිර්මාණය, නිරූපිතය හෝ වෙනත් ඕනෑම කරුණක් පිළිබඳව කිසිඳු නියෝජනයක් බැංකුව විසින් සිදු නොකරනු ඇත. එසේම මෙම නිෂ්පාදන / සේවාවන් උපයෝජ්‍යතාවයට යටත් වන අතර පළමු පැමිණෙන්නා සඳහා පළමුව සේවය කිරීමේ පදනම යටතේ කටයුතු කරනු ඇත.

27.10 අදාළ වෙළඳ ස්ථානයන් මගින් ලබා දෙනු ලබන විශේෂ වට්ටම් / දීමනා හා සම්බන්ධව බැංකුව විසින් කිසිඳු වගකීමක් දරනු නොලැබේ.

27.11 බැංකුව විසින් එවනු ලබන ලිපි නැවත හරවා ලැබේනම් සහ කාඩ්පත්හිමියා සම්බන්ධ කර ගැනීමට නොහැකි නම්, කාඩ්පත්හිමියාගේ ගිණුම් ප්‍රකාශන සහ / හෝ ලිපි ලේඛන, ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කර ඇති වෙනත් ලිපිනයක් වෙත නැවත යැවීමේ අයිතිය බැංකුව සතු වේ.

27.12 කාඩ්පත්හිමියාහට ඕනෑම ගනුදෙනුවක්/ගනුදෙනු පිලිබඳ යම් මතභේදයක් ඇත්නම්, බැංකුව විසින් එම මතභේදයන් පිළිබඳව විමර්ශන සිදු කරනු ඇත. කෙසේ වුවද, අදාළ විමර්ශනයන් සිදු කරන අතරතුරදී කාඩ්පත්හිමියා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අදහස් නොකරන්නේ නම් හෝ අදාළ විමර්ශන සඳහා සහය ලබා දීමට බැංකුව වෙත නොපැමිණෙන්නේ නම් හෝ CCTV හා අනෙකුත් සාක්ෂි නිරීක්ෂණය කිරීමට අකමැති නම් හෝ අදාළ වෙළඳ ස්ථානය හෝ ATM වෙත පැමිණීමට අදහස් නොකරන්නේ නම් සියලුම මතභේදාත්මක ගනුදෙනු සඳහා වගකීම කාඩ්පත්හිමියා විසින් දැරිය යුතුය.

28. **කොන්දේසි වල වෙනස්වීම්**

28.1 මෙම ගිවිසුමෙහි කොන්දේසි හා නියමයන් බැංකුව විසින් කලින් කලට වෙනස් කරනු ඇත. නීතිමය අවශ්‍යතාවයන්ට යටත්ව, එවැනි ඕනෑම වෙනස් කිරීමක් පිලිබඳ දැනුම්දීමක් බැංකුව විසින් කාඩ්පත්හිමියා වෙත ලිඛිතව හෝ ඒ පිලිබඳ ප්‍රකාශයට පත් කිරීම මගින් සිදු කරනු ඇත. එවැනි වෙනස් කිරීම්, සියලුම නොගෙවූ මූල්‍ය ගාස්තු, ගාස්තු, මුදල් අත්තිකාරම්, පිරිවැය සහ කාඩ්පත් ගනුදෙනු සඳහා අදාළ වේ.

28.2 මෙම ගිවිසුමෙහි කොන්දේසි හා නියමයන්හි එවැනි ඕනෑම වෙනසක බලාත්මක දිනයෙන් පසු කාඩ්පත ළඟ තබා ගැනීම හෝ භාවිතා කිරීම මගින් කිසිදු විශේෂ නියමයකින් තොරව කාඩ්පත්හිමියා විසින් එම වෙනස්කම් සියල්ල පිළිගත් බවට සලකනු ලැබේ. යෝජනා කරන ලද වෙනස්කම් කාඩ්පත්හිමියා විසින් පිලි නොගන්නේනම්, එම වෙනස්කම බලාත්මක වන දිනට පෙර ලිඛිත දැනුම් දීමක් මගින් කාඩ්පත්හිමියා විසින් කාඩ්පත භාවිතය අවසන් කල යුතු අතර මෙහි 19 වන වගන්තිය (අවලංගු කිරීම) එම අවස්ථාවේ සිට ක්‍රියාත්මක වනු ඇත.

29. ගිවිසුමෙහි බලපෑම්

29.1 මෙම ගිවිසුම අවසන් කිරීම නොතකා, සිදු කරනු ලැබූ ඕනෑම කාඩ්පත් ගනුදෙනුවක් හා සම්බන්ධව හා ඒ යටතේ ඇතිවන කාඩ්පත්හිමියගේ/පරිපූරක කාඩ්පත්හිමියා / කාඩ්පත්හිමියන්ගේ වගකීම් හා සම්බන්ධව කාඩ්පත්හිමියාට සහ ඕනෑම පරිපූරක කාඩ්පත්හිමියකු /කාඩ්පත්හිමියන් හට බලපැවැත්වෙන පරිදි මෙහි අඩංගු සියලු විධිවිධාන පූර්ණ බලය හා බලපෑම යටතේ නොකඩවා ක්‍රියාත්මක වනු ඇත.

29.2 මෙහි සඳහන් කොන්දේසි හා නියමයන් සෑම එකක්ම එකිනෙකින් වෙන්ව හා වෙනස්ව පවතින අතර ඕනෑම අවස්ථාවකදී එවැනි කොන්දේසි හා නියමයන්ගෙන් එකක් හෝ කිහිපයක් අවලංගු, නීති විරෝධී හෝ බල රහිතනම් හෝ එසේ වුව හොත් ඉතිරි විධිවිධානයන්හි වලංගුභාවය, නීත්‍යානුකූලභාවය හෝ බලාත්මකතාවය සඳහා එමගින් බලපෑමක් හෝ හානි වීමක් සිදු නොවනු ඇත.

30. **කාඩ්පත්හිමියා විදේශගත වීමේදී ක්‍රියාපටිපාටිය**

කාඩ්පත්හිමියෙකු විදේශයක රැකියාවක් කිරීම සඳහා සංක්‍රමණය වන හෝ ශ්‍රී ලංකාවෙන් පිටත්වන අවස්ථාවකදී ඒ පිළිබඳ බැංකුව වෙත ලිඛිතව දැනුම්දිය යුතු අතර කාඩ්පත වෙත බිල් කල හා නොකළ සියලුම ගාස්තු පියවා අවසන් කර කාඩ්පත්හිමියාගේ පිටත්වීමට දින තිහකට (30) පෙර කාඩ්පත හා සියලුම පරිපූරක කාඩ්පත් නැවත භාර දිය යුතුය. කාඩ්පත හෝ පරිපූරක කාඩ්පත (කාඩ්පත්) භාවිතය අවලංගු කල බවට එමගින් සලකනු ලබන අතර එහිදී 19 වන වගන්තිය (අවලංගු කිරීම) අදාළ වනු ඇත. පුද්ගලික විදේශ මුදල් ගිණුමක් (PFCA) හෝ විදේශ මුදල් ව්‍යාපාර ගිණුමක් (BFCA) පවතින ගිණුම්හිමියෙකුට හා ලැබෙන ප්‍රේෂණයන් මගින් හිඟ මුදල් ගෙවනු ලබන හෝ විදේශ මුදල් ගිණුම් මගින් මුදල් මාරු කරනු ලබන පදනමෙන් හැර වෙනත් ඕනෑම ගිණුම්හිමියෙකු වෙත කාඩ්පතක් නිකුත් කරනු ලැබූ අවස්ථාවන්හි දී මෙය අදාළවේ.

31. **විදෙස් ජාතිකයන්හට කාඩ්පත් නිකුත් කිරීම**

ශ්‍රී ලංකා මහා බැංකුවෙන් නිකුත් කරන ලද දැනට පවතින රෙගුලාසි හා වෙනත් නියාමන බලධාරීන් විසින් නිකුත් කරනු ලැබූ වෙනත් රෙගුලාසි වලට අනුව විදේශ ජාතිකයින් හට කාඩ්පතක් නිකුත් කරනු ඇත. කාඩ්පත්හිමියා ස්ථිරවම රට හැර යන්නේ නම්, එසේ යාමට මසකට පෙර සහ හෝ කාඩ්පත්හිමියාගේ පදිංචි වීසා පත කල් ඉකුත් වීමට මසකට පෙර ඒ බව ලිඛිතව බැංකුව වෙත දැනුම් දිය යුතුය. ඉහත සඳහන් අවස්ථාවන්ගෙන් ඕනෑම එකකට පෙර කාඩ්පත්හිමියා විසින් බිල්පතට එකතු කල සහ නොකළ ගාස්තු සම්පූර්ණ වශයෙන් ගෙවා කාඩ්පත (කාඩ්පත්) බැංකුව වෙත නැවත භාර දිය යුතුය.

32. **විදේශ විනිමය හුවමාරු ගනුදෙනු සඳහා පරිවර්තන ගාස්තු**

ශ්‍රී ලංකා රුපියල හැර වෙනත් මුදල් ඒකකයක් මගින් සිදු කරනු ලැබූ ගනුදෙනු කාඩ්පත වෙත හර වන්නේ එම පරිවර්තනය සිදු වන දිනයේදී අදාළ ගෙවුම් කාඩ්පත් සංවිධානය මගින් සම්මත කර ගන්න ලද විනිමය අනුපාතිකයට අනුව තීරණය කරනු ලැබූ විනිමය අනුපාතිකයකට අනුව සහ බැංකුව විසින් එයට එකතු කරනු ලබන අමතර ප්‍රතිශතයක් හා බැංකුව වෙත අදාළ ගෙවුම් කාඩ්පත් සංවිධානය මගින් අය කරනු ලැබූ ඕනෑම ගනුදෙනු ගාස්තුවක් (ගාස්තු) ද ඇතුළුව, එය නැවත ශ්‍රී ලංකා රුපියල වෙත පරිවර්තනය වීමෙන් පසුවය.

33. **පාලන නීති**

33.1 කොන්දේසි හා නියමයන් පාලනය කරනු ලබන්නේ හා අර්ථ නිරූපනය කරනු ලබන්නේ ශ්‍රී ලංකාවෙහි පවතින නීතියට අනුව වන අතර කාඩ්පත්හිමියා ශ්‍රී ලංකාවේ අධිකරණයෙහි පරම අණසකට අවලංගු කල නොහැකි ලෙස යටත් වේ. කෙසේ වුවද එවැනි යටත් වීමක්, කාඩ්පත්හිමියාට එරෙහිව බැංකුවහට වෙනත් අධිකරණ බලයක් යටතේ ක්‍රියා කිරීමට ඇති අයිතිය අගතියට පත් නොකරනු ඇත.

33.2 නීතිය මගින්, රජයේ රෙගුලාසි මගින් හෝ ශ්‍රී ලංකා මහා බැංකුව විසින් සහ වෙනත් අදාළ නියාමන අධිකාරීන් විසින් නිකුත් කරනු ලැබූ උපදෙස් වලට අනුව අත්‍යාවශ්‍ය ලෙස වෙනස් වීමක් සිදුවුවහොත්, මෙම කොන්දේසි හා නියමයන් ස්වයංක්‍රීයව වෙනස් වනු ඇත. නීත්‍යානුකූල හා වලංගු අරමුණු සඳහා පමණක් කාඩ්පත් ගිණුම භාවිතා කල හැකිවේ. වෙනත් අරමුණක් සඳහා කාඩ්පත්හිමිය කාඩ්පත භාවිතා කල හෝ තුන්වන පාර්ශවයක්හට කාඩ්පත භාවිතා කිරීමට ඉඩ ලබා දුන් අවස්ථාවකදී, ඒ සඳහා කාඩ්පත්හිමියා වගකිව යුතු වන අතර එවැනි භාවිතයක් නිසාවෙන් පාර්ශව තුනටම හෝ එක අයෙකුට ගෙවීමට සිදු වන සියලුම මුදල් සහ / හෝ වියදම් බැංකුව වෙත හෝ අදාළ ගෙවුම් කාඩ්පත් සංවිධානය වෙත නැවත ගෙවීමට සිදු වනු ඇත. එවැනි අවස්ථාවකදී, වහාම එවැනි ගෙවීම් අත්හිටුවා විදේශ විනිමය අධ්‍යක්ෂකවරයා වෙත සහ වෙනත් ඕනෑම අදාළ නියාමන අධිකාරියක් වෙත ඒ පිලිබඳ දැනුම් දීමේ අයිතිය බැංකුව සතු වේ.

33.3 කාඩ්පත මගින් අනවසර විදේශ විනිමය ගනුදෙනු සිදු වී ඇති බවට සැක කිරීමට බැංකුවහට සාධාරණ හේතු ඇත්නම්, කාඩ්පතෙහි විදේශ විනිමය ගනුදෙනු සිදු කිරීමේ හැකියාව වහාම අත්හිටුවා විදේශ විනිමය අධ්‍යක්ෂකවරයා වෙත සහ වෙනත් ඕනෑම අදාළ නියාමන අධිකාරියක් වෙත ඒ පිලිබඳ දැනුම් දීමේ අයිතිය බැංකුව සතු වේ. එමෙන්ම එලෙස විදේශ විනිමය හා සම්බන්ධව කාඩ්පත්හිමියා විසින් සිදුකරනු ලැබූ ගනුදෙනු පිලිබඳ තොරතුරු ලබා ගැනීමේ අයිතියද බැංකුව සතු වේ.

33.4 පුද්ගලික විදේශ මුදල් ගිණුමක (PFCA) හෝ ව්‍යාපාර විදේශ මුදල් ගිණුමක (BFCA) ඇති මුදල් වලට එරෙහිව නිකුත් කරනු ලැබූ කාඩ්පතක් ඇති අවස්ථාවකදී සහ කාඩ්පතෙහි හිඟ මුදල් අභ්‍යන්තර ප්‍රේෂණ මගින් හෝ විදේශ මුදල් ගිණුම් වෙතින් මාරු කිරීම මගින් පියවනු ලබන අවස්ථාවකදී හැර, කාඩ්පත්හිමියා වෙනත් රටකට සංක්‍රමණය වුවහොත් හෝ රැකියාවක් සඳහා විදේශගත වුවහොත්, කාඩ්පත නිකුත් කරනු ලැබූ බැංකුව වෙත කාඩ්පත නැවත භාර දිය යුතුය.

33.5 2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි 9 (1) සහ 9 (2) වගන්ති වලට අනුව, 2017 අංක 2 දරන නියෝගයට අනුව හා 2017 නොවැම්බර් 17 දිනැති 2045/56 දරණ ගැසට් පත්‍රයට අනුව ශ්‍රී ලංකාවෙහි වෙසෙන පුද්ගලයෙකුහට විදේශයක ජීවත්වන පුද්ගලයෙකු වෙත විදේශ විනිමය මගින් ගෙවීම් සිදු කිරීමට, පහත කරුණු යටතේ අවසර ලබා දෙනු ලැබේ.

i. වාණිජ කටයුතු සඳහා භාණ්ඩ ආනයනය කිරීම් සඳහා සිදුකරන ගෙවීම් වලට අමතරව පුද්ගලික ස්වභාවයෙන් පවතින ගනුදෙනුවක් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත ජීවත්වන පුද්ගලයෙකුහට සිදු කරනු ලබන ඕනෑම ගෙවීමක්

ii. ව්‍යාපාර විදේශ මුදල් ගිණුමකට (BFCA) හෝ පුද්ගලික විදේශ මුදල් ගිණුමකට (PFCA) එරෙහිව EFTC නිකුත් කරනු ලබන ඕනෑම අරමුණක් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත ජීවත්වන පුද්ගලයෙකුහට සිදු කරනු ලබන ඕනෑම ගෙවීමක්

iii. රාජ්‍ය තාන්ත්‍රික විදේශ මුදල් ගිණුමකට (DFA) හෝ ආමුඛ ආයෝජන ගිණුමකට (IIA) එරෙහිව ක්‍රෙඩිට් කාඩ්පතක් නිකුත් කරනු ලබන ඕනෑම අරමුණක් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත ජීවත්වන පුද්ගලයෙකුහට සිදු කරනු ලබන ඕනෑම ගෙවීමක්

2. පුද්ගලික විදේශ මුදල් ගිණුමක (PFCA) හෝ ව්‍යාපාර විදේශ මුදල් ගිණුමක (BFCA) ඇති මුදල් වලට එරෙහිව නිකුත් කරනු ලැබූ කාඩ්පතක් ඇති අවස්ථාවකදී සහ කාඩ්පතෙහි හිඟ මුදල් අභ්‍යන්තර ප්‍රේෂණ මගින් හෝ විදේශ මුදල් ගිණුම් වෙතින් මාරු කිරීම මගින් පියවනු ලබන අවස්ථාවකදී හැර කාඩ්පත්හිමියා වෙනත් රටකට සංක්‍රමණය වුවහොත් හෝ රැකියාවක් සඳහා විදේශගත වුවහොත් එම පුද්ගලයා සඳහා නිකුත් කරනු ලැබූ කාඩ්පත, කාඩ්පත නිකුත් කරනු ලැබූ බැංකුව වෙත නැවත භාර දිය යුතුය යන නියමයට යටත්ව ක්‍රෙඩිට් කාඩ්පත් හා ඩෙබිට් කාඩ්පත් නිකුත් කරනු ලැබේ.

3. ඩෙබිට් කාඩ්පත භාවිතා කරමින් විදේශ විනිමය මුදල් ආපසු ගැනීම හෝ ක්‍රෙඩිට් කාඩ්පත හරහා මුදල් අත්තිකාරම් ලබා ගැනීම මගින් ලබා ගත් මුදල් 2017 අංක 12 දරණ විදේශ විනිමය පනතෙහි විධිවිධාන යටතේ නිකුත් කරන ලද නියෝග හා රෙගුලාසි වලට අනුව භාවිතා කල බවට සාක්ෂි කාඩ්පත්හිමියා විසින් තමා ලග තබා ගැනීම අවශ්‍ය වේ.

4. පහත සඳහන් කරුණු වලට යටත්ව ක්‍රෙඩිට් කාඩ්පත නිකුත් කරනු ලැබේ.

i. ශ්‍රී ලංකාවෙහි විදේශ කටයුතු අමාත්‍යංශය විසින් නිකුත් කරන ලද රාජ්‍ය තාන්ත්‍රික විදේශ ගමන් බලපත්‍රය සහ රාජ්‍ය තාන්ත්‍රික හැඳුනුම්පත දරන විදේශීය පුරවැසියන්හට ක්‍රෙඩිට් කාඩ්පත් නිකුත් කරනු ලැබේ.

ii. එවැනි කාඩ්පත්, ඇපකරයක් වශයෙන් තබා ඇති ශ්‍රී ලංකාවෙහි පවතින විදේශ මුදල් ගිණුමෙහි ඇති මුදල් ප්‍රමාණයෙන් 90%ක සීමාවක් දක්වා පමණක් නිකුත් කරනු ලබන අතර එවැනි කාඩ්පත් මගින් දරනු ලබන වියදම් පියවීම, විදේශයන්ගෙන් ලැබෙන අභ්‍යන්තර ප්‍රේෂණ හරහා හෝ එම පුද්ගලයා විසින් පවත්වා ගෙන යනු ලබන විදේශ මුදල් ගිණුම් මගින් මුදල් හුවමාරු කිරීම මගින් සිදු කල යුතුය.

5. විදේශ විනිමය දෙපාර්තමේන්තුවෙහි අධ්‍යක්ෂකවරයාගේ පූරවා ලිඛිත අනුමැතිය අවශ්‍ය වන අරමුණු සඳහා හැර, EFTC මගින් ඕනෑම අරමුණක් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත ජීවත්වන පුද්ගලයෙකුහට සිදු කරනු ලබන ඕනෑම ගෙවීමක්

6. සියලුම EFTC කාඩ්පත්හිමියන් විසින් අදාළ ප්‍රකාශනය (ඇමුණුම 1 ට අනුව) ලබා දිය යුතුය.

7. EFTC හි හිමිකරු විසින් එය අනවසර කාර්යන් සඳහා යොදා ගන්නා බවට සැක කිරීමට හේතු සාධක තිබේනම්, එම EFTC මගින් සිදු කරනු ලබන විදේශ විනිමය ගෙවීම් අත්හිටුවීමට බැංකුව විසින් වහාම පියවර ගනු ඇත.

8. සන්ධර්භය විසින් වෙනත් අර්ථයක් ලබා නොදෙන්නේ නම්, මෙම නිවේදනයේ අරමුණු සඳහා;

i. “බලයලත් බෙදාහරින්නා” යන්නෙන් විදේශ විනිමය පනතෙහි දක්වා ඇති පරිදිම අර්ථ දැක්වේ.

ii. “ඉලෙක්ට්‍රොනික මුදල් හුවමාරු කාඩ්පත (EFTC)” යන්නෙන්, බලයලත් වෙළඳුන් විසින් විදේශ විනිමය පනතෙහි විධිවිධාන වලට අනුකූලව කටයුතු කිරීමේ අරමුණින් ගනුදෙනු පිලිබඳ විස්තර හඳුනාගත හැකි ආකාරයේ ක්‍රෙඩිට් කාඩ්පත්, ඩෙබිට් කාඩ්පත් සහ වටිනාකම් ගබඩා කල කාඩ්පත් (stored value cards) ඇතුළුව, භාවිතා කරන්නාහට හර, බැර හෝ වෙනත් ආකාරයකින් මුදල් මාරු කිරීමේ අවස්ථාව ලබා දෙනු ලබන කාඩ්පතක් හෝ උපාංගයක් අදහස් වේ.

iii. “ක්‍රෙඩිට් කාඩ්පත” යන්නෙන් භාවිතා කරනු ලබන ණය ප්‍රමාණය, නිශ්චිත දිනයකදී හෝ ඊට පෙර සම්පුර්ණයෙන් හෝ කොටස් වශයෙන් පියවිය හැකි ණය ක්‍රියාමාර්ගයක් ඇතුලත් කාඩ්පත්හිමියා වෙත නිකුත් කරන ලද ගෙවුම් කාඩ්පත අදහස් වේ. අදාළ දිනය වන විට පියවීමට අපොහොසත්වූ ණය ප්‍රමාණය සඳහා කාඩ්පත නිකුත් කරන්නා විසින් පොලියක් සහ වෙනත් ගාස්තු අය කරනු ඇත.

iv. “පුද්ගලික” යන්නෙන් කාඩ්පත්හිමියා, ඔහුගේ/ඇයගේ කාලත්‍රයා, දරුවන් සහ දෙමාපියන් සඳහා භාවිතා වන අතර වාණිජ කටයුතු සඳහා භාවිතා කිරීම අදාළ නොවේ.

වැඩිදුර විමසීම් සඳහා 011+94 117 640 640 හරහා ඕනෑම අවස්ථාවකදී අපගේ පාරිභෝගික සේවා මධ්‍යස්ථානය අමතන්න.